# නිහාල් ශ්‍රී අමරසේකර - හිල්ටන් හෝටල නඩුව

## “ අසත්‍යය යටපත්කර සත්‍යය හිස ඔසවයි ! ”

මම, 1990 තරම් ඈත කාලයේ සිටම නිහාල් ශ්‍රී අමරසේකර විසින් ගොණු කරනු ලැබූ හිල්ටන් හෝටලයේ ඉදිකිරීම් පිළිබඳ නීතිමය ව්‍යුත්පන්න නඩු සමඟ සම්බන්ධව කටයුතු කල නීතිඥයන් 21 දෙනාගෙන් එක් අයෙකු වෙමි. එහි එක් නඩුවක් රටෙහි උත්තරීතරම අධිකරණය වූ ශ්‍රේෂ්ඨාධිකරණයේ ජයග්‍රාහී ඓතිහාසික තීන්දුවක් ලබා දීම දක්වා ඉදිරියට සිදු කෙරුණු අතර, එය පොදු රාජ්‍ය මණ්ඩලීය වාණිජ නීති වාර්තා වල වාර්තා වී ඇත. *[1992] LRC (Comm)@636 – අමරසේකර එදිරිව මිට්සුයි සහ සමාගම සහ අනෙකුත් පාර්ශවයන්.*

එබැවින්, සැබෑ කරුණු මුළුමනින්ම නොදැන සිටින පුද්ගලයන් විසින් ප්‍රකාශයට පත් කරන සහ ප්‍රකාශ කරන නොමග යවන වැරදි සහගත අමූලික අසත්‍ය ද්වේශසහගත රාවයන් බිඳහෙලමින්, මා විසින්, සත්‍ය කරුණු, මාගේ අනුදැනුම පරිදි සහ ලේඛන මගින් සහ අමරසේකර මගින් තහවුරු කර ගෙන විදහා පෙන්වමි.

1. අමරසේකර, අන් අය අතර, හොටෙල් ඩිවලොපර්ස් (ලංකා) පීඑල්සී (HDL) සමාගමේ අනුග්‍රාහකයෙකු, කොටස්කරුවකු, අධ්‍යක්ෂකවරයකු සහ සභාපති ලෙස කටයුතු කර ඇත. **<u>කොළඹ හිල්ටන් හෝටලය සම්බන්ධ මෙම කාරණය ඔහුගේම ව්‍යාපාරික කාර්යයක් වූ අතර, මහජන සුභ සිද්ධිය සඳහා පැනවූ නඩු නිමිත්තක් නොවිය.</u>**

2. ශ්‍රී ලංකා රජය විසින් ලබා දුන් රාජ්‍ය ඇපකර මත, කොළඹ හිල්ටන් හෝටලය ඉදි කිරීමේ කටයුතු ජපන් සමාගම් වන මිට්සුයි සහ තායිසෙයි සමාගම් විසින් සිදු කිරීමේදී සිදුවූ සහ අමරසේකර විසින් ගවේෂණය කර අධ්‍යක්ෂ මණ්ඩලය වෙත හෙළි කරනු ලැබූ බරපතල වංචාවන් පිළිබඳව, HDL සමාගමේ අධ්‍යක්ෂකවරුන් විසින් අන්ධභාවයකින් කිසිදු සැලකිල්ලක් ගෙන නොතිබුණි.

3. ඒ අනුව, අනෙකුත් අධ්‍යක්ෂකවරුන්ගේ, පුද්ගලයින්ගේ සහ එසේම රජයේ බාධා කිරීම් සහ පීඩනයන් හමුවේ පවා, අමරසේකර විසින්, එම බරපතල වංචාව පිළිබඳ කරුණු මත පදනම්ව නීතිය ඉදිරියේ ව්‍යුත්පන්න නඩු දෙකක් ඔහු විසින්ම ගොණු කරනු ලැබ, එහි ප්‍රතිඵලයක් ලෙස, ‘රටෙන් මහා පරිමාණයෙන් වංචනික ලෙස විදේශ විනිමය බැහැර කිරීම වලක්වා ලමින්, අපේක්ෂා කල පරිදි සාර්ථකව ඔප්පු කළ හැකි බරපතල වංචාක් පිළිබඳ නඩු නිමිත්තක් තිබේ යයි ස්ථිර ලෙස සනාථ කරමින් සහ රජය විසින් ඇපකරු ලෙස මෙය නොතකා හැර උදාසීන ලෙස කටයුතු කල නොහැකි බවට ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ප්‍රකාශ කරමින්, රාජ්‍ය ඇපකර මත රජය විසින් හෝ HDL සමාගම විසින් මිට්සුයි සහ තායිසෙයි සමාගම් වෙත ඉල්ලා තිබූ සියලුම ගෙවීම් කිරීම අත්හිටුවන ලදී.’

4. **මිට්සුයි සහ තායිසෙයි සමාගම් විසින් හිල්ටන් හෝටලය ඉදි කිරීමේදී, එය ඉදි කිරීම සඳහා වූ මුල් ව්‍යුහයෙන් භෞතිකව බරපතල ලෙස වෙනස් කරමින් සිදු කල මහාපරිමාණ වංචාව මත, අවසාන සහනයන්ගෙන් අමරසේකර අයැද සිටින ලද්දේ ඔවුනට කිසිදු අයුරකින් ගෙවීමක් සිදු නොකළ යුතු බවය.** *(මෙය සිලින්ඩර 6 ක ධාරිතාවයකින් යුතු සුපිරි වාහනයක් සඳහා සිලින්ඩර 4 ක ධාරිතාවයකින් යුතු බාල වර්ගයේ වාහනයක් සැපයීම නිසා එය තරයේ ප්‍රතික්ෂේප කොට මුදල් නොගෙවීමය. )*

**5.** ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයෙන් වර්ෂ තුනක් ඇතුලත සිදු කිරීමට ඉඩ තිබූ මිට්සුයි සහ තායිසෙයි සමාගම් විසින් කල ඉදිකිරීම් සඳහා යුක්තිසහගත ගෙවීමක් කිරීම සඳහා මිට්සුයි සහ තායිසෙයි සමාගම් විසින් යථායෝග්‍ය ප්‍රමාණයේ (*quantum meruit* ) අයැදුමක් ඉදිරිපත් කල හැකිව තිබුණ නමුදු, මිට්සුයි සහ තායිසෙයි සමාගම් විසින් හිල්ටන් හෝටලය ඉදි කිරීමේදී බරපතල වංචාවක් සිදුවූ බවට එසේ කිරීමේදී පිළිගැනීමට සිදුවන නිසා, මිට්සුයි සහ තායිසෙයි සමාගම් විසින් එසේ අයැදුමක් ඉදිරිපත් නොකරන ලදී. ඒ අනුව, **අවසාන සහන ලබාදීමේදී මිට්සුයි සහ තායිසෙයි සමාගම් වලට කිසිදු අයුරක ගෙවීමක් කිරීමට නැති බව, පෙත්සමේ අයැදීම් වලට අනුව නියෝගයක් අවසානයේ ප්‍රධානය වීමට තිබුණි.**

6. අමරසේකරගේ ජ්‍යෙෂ්ඨ නීතිඥවරුන් වූයේ රජින නීතිඥ පී. නවරත්නරාජා, ජනාධිපති නීතිඥ එච්. එල්. ද සිල්වා සහ ජනාධිපති නීතිඥ කේ. කනග්-ඊශ්වරන් සහ අනෙකුත් නීතිඥවරුන්, ඔවුන් අතරින් සමහරක් ශ්‍රී ලංකාවේ නීතියෙහි මෙවැනි පූර්වාදර්ශ ව්‍යුත්පන්න නඩු සඳහා පෙර නඩු පරිශීලනයන් සහ නිගමනයන් සම්බන්ධව විශේෂයෙන්ම පර්යේෂණ සිදු කරන නීතිඥවරුන්ද විය.

7. මෙයට අමතරව, ෂෙල්ටන් විජේරත්න, විලියම්ස් සහ ඇසෝසියේට්ස්, වරලත් ගෘහ නිර්මාණ ශිල්පී, ඉංජිනේරු සහ මිනින්දෝරු ආයතනයේ විමර්ශන වාර්තාවක්ද අමරසේකර විසින් අධිකරණයේ ගොනු කර තිබුණි.

8. මෙම නඩු කටයුතු වලට මුදල් ලබා ගැනීම සඳහා අමරසේකර විසින් බියගම ප්‍රදේශයේ ප්‍රධාන මාර්ගය දෙපස ඔහු සතුව තිබූ අක්කර 7 ක වටිනා ඉඩම් රුපියල් මිලියන 5.5 කට විකුණා දැමීමට එම අවස්ථාවේදී ඔහුට සිදු විය. ඔහු එසේ සිදු නොකරන ලද්දේ නම්, එම ඉඩම් මේ වන විටත් ඔහු සතුව පවතින අතර, එසේ වූයේ නම්, 2016.12.31 දිනට එහි වෙළඳපොළ වටිනාකම රුපියල් මිලියන 1,200 කට ආසන්න අගයක් වනු ඇත.

9. සත්‍ය වශයෙන්ම, දිසා අධිකරණ විසින් වාරණ නියෝග නිකුත් කිරීම මත, ඇතිවූ විභව තර්ජන හේතුවෙන්, ඒ අවස්ථාවේදී ඔහුගේ පවුලේ ඉල්ලීම් මත, අමරසේකර විදෙස්ගත වී ඇත. ඔවුන් බියට පත් වූයේ, ඒ වන විටත් හිටපු අගමැති සිරිමා බණ්ඩාරණායක විසින් ජනාධිපතිවරණයේදී පාර්ලිමේන්තු මන්ත්‍රී ආර්. ප්‍රේමදාස ඉදිරියේ මැතිවරණයෙන් පරාජයට පත්වීමෙන් අනතුරුව ගොනු කරනු ලැබූ ජනාධිපතිවරණ පෙත්සම් නඩුවෙහි ජනාධිපති ආර්. ප්‍රේමදාස වෙනුවෙන් ඉදිරිපත්ව සිටි ඔහුගේ ජ්‍යෙෂ්ඨ නීතිඥ පාර්ලිමේන්තු මන්ත්‍රී ජනාධිපති නීතිඥ කේ. එන්. චොක්සි අමරසේකරගේ ප්‍රධාන නඩු නිමිත්තේද ප්‍රධාන විත්තිකරුවෙකු ලෙස නම්කර සිටි බැවින්, එවැනි කාලයකදී පැහැරගැනීමට ලක් වූ රිචඩ් ද සොයිසාහට සිදුවූ ඉරණමටම ඔහුටද මුහුණ දීමට සිදු වනු ඇතැයි සිතමිනි.

10. ඒ අනුව, මම පෞද්ගලිකව එහි රැඳී සිටියදි, මා ඉදිරිපිටම ජ්‍යෙෂ්ඨ නීතිඥ, රජින නීතිඥ පී. නවරත්නරාජා විසින් ඔහුගේ නිලකුටියේ සිට ජනාධිපති ආර් ප්‍රේමදාස වෙත දුරකථනයෙන් අමතා, හිල්ටන් හෝටල් නඩුව ඔහුගේ නඩුවක් බවත්, අමරසේකර ඔහුගේ සේවාදායකයෙකු බවත් පවසමින් මේ සම්බන්ධයෙන් ඇඟිලි නොගසන ලෙසට ජනාධිපති ආර් ප්‍රේමදාසට තරයේ අවවාද කරන ලදී .

11. පළමුවන නඩුවේ පැමිණිල්ල ජොෂ්ඨ නීතිඥ, රජිත නීතිඥ පී. නවරත්නරාජා විසින් දිස්ත්‍රික් අධිකරණයට ඉදිරිපත් කොට තහවුරු කිරීමත් සමගම, ඒ විගසම දිස්ත්‍රික් අධිකරණය විසින් වහාම වාරණ නියෝග දෙන ලදී. එම වාරණ නියෝග නිසා ශ්‍රී ලංකාවේ විදේශ විනිමය සංචිත ප්‍රමාණය ඉතා අවම මට්ටමක පැවති එම අවස්ථාවේදී, මිට්සුයි සහ තායිසෙයි සමාගම් විසින් ඔවුන් වෙත නිකුත් කරනු ලැබූ රාජ්‍ය ඇපකර යටතේ සිදු කල පැහැර හැරීම් සම්බන්ධව මුදල් අමාත්‍යාංශයේ ලේකම් වෙත දැණුම් දීමෙන් අනතුරුව, රටේ විදේශ ණය ගැනීම් සම්බන්ධ ජාත්‍යන්තර හරස් පැහැර හැරීමේ අවක්ෂේපණය වලක්වාලන ලදී.

12. එම නිසා එම වාරණ නියෝග වහාම එවකට ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ශ්‍රී ලංකා අධ්‍යක්ෂක ආචාර්ය එල්. ඊ. එන්. ප්‍රනාන්දු වෙත ෆැක්ස් මගින් යවන ලද අතර, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමඟ සාකච්ඡා කිරීම් වලදී එම වාරණ නියෝග වලින් ශ්‍රී ලංකා රජය ප්‍රයෝජන ලබා ගෙන ඇත. ඉන්පසුව භාණ්ඩාගාර ලේකම් අර්. පාස්කරලිංගම් විසින් ශක්තිමත්ව ඔහුගේ ඍජු ස්ථාවරයේ සිටින ලෙස අමරසේකරව දිරි ගන්වා ඇත.

13. ඉන් අනතුරුව, නීතිපති, ජනාධිපති නීතිඥ සුනිල් ද සිල්වා විසින් අමරසේකර සමඟ මෙම නඩුව සම්බන්ධයෙන් සාකච්ඡා කිරීමට අවශ්‍ය බව, ජොෂ්ඨ නීතිඥ, රජිත නීතිඥ පී. නවරත්නරාජා වෙත දැනුම් දී ඇත. ඒ අනුව අමරසේකර සමඟ නීතිපති, ජනාධිපති නීතිඥ සුනිල් ද සිල්වා හමුවීමට ඔහුගේ නිලකුටියට යැමට ජොෂ්ඨ නීතිඥ, රජිත නීතිඥ පී. නවරත්නරාජා විසින් මට උපදෙස් දෙන ලදී.

14. අමරසේකරගේ කරුණු පැහැදිලි කිරීම් වලට සවන් දීමෙන් පසුව, නීතිපති ජනාධිපති නීතිඥ සුනිල් ද සිල්වා විසින් HDL සමාගම වෙනුවෙන් පෙනී සිටින ඔහු අමරසේකරගේ නඩු නිමිත්තට විරුද්ධ නොවන බව පවසමින්, රටේ යහපත උදෙසා සාර්ථකව ඔහුගේ නඩුව ජය ගැනීමට සුභ පතන ලදී.

15. එයට පටහැනිව ක්‍රියා කරමින්, දිස්ත්‍රික් අධිකරණය විසින් ඉහත වාරණ නියෝගය නිකුත් කිරීමෙන් පසුව, අධිකරණය ඉදිරියේ හෙළි වූ ඉහතකී මහාපරිමාණ වංචාව ආවරණය කිරීමට උත්සාහයක් දරමින්, වරලත් ගණකාධිකාරී KPMG ෆෝර්ඩ් රෝඩ්ස් තෝන්ටන් සහ සමාගම විසින් සහතික කරනු ලැබූ HDL සමාගමේ වාර්ෂික ගිණුම් සම්මත කිරීමට HDL සමාගමේ අධ්‍යක්ෂකවරුන් උත්සාහ දරන ලදී. එවැනි තත්වයක ප්‍රතිඵලයක් වශයෙන් අමරසේකර හට නීතියේ තවත් ව්‍යුත්පන්න නඩුවක් ගොණු කිරීමට සහ එමගින් එකී HDL සමාගමේ වාර්ෂික ගිණුම් සම්බන්ධව අධිකරණය මගින් වාරණ නියෝගයක් ලබා ගැනීමට සිදු විය.

16. අවසාන වශයෙන්, වරලත් ගණකාධිකාරී KPMG ෆෝර්ඩ් රෝඩ්ස් තෝන්ටන් සහ සමාගම HDL සමාගමේ විගණකයින් ලෙස කටයුතු කිරීමෙන් ඉවත් කරන ලෙසට සහ HDL සමාගමේ එකී වාර්ෂික ගිණුම් වෙනත් වරලත් ගණකාධිකාරී ආයතනයක් මගින් නැවත නිවැරදි ලෙස සකස් කර සහතික කිරීමට කටයුතු කල යුතු බවට අධිකරණය විසින් තීන්දු ප්‍රකාශයක් නිකුත් කරන ලදී.

17. අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව මගින් විමර්ශන සිදු කිරීමෙන් පසුව, සහ වරලත් ගෘහ නිර්මාණ ශිල්පීන් 3 දෙනෙකුගෙන් සමන්විත කමිටුවක් මගින් විමර්ශන වාර්තාවක් ලබා දීමෙන් අනතුරුව, සොලිස්ටර් ජනරාල්ගේ උපදෙස් මත, විශේෂ ජනාධිපති කොමිෂමක් විසින්, ශ්‍රී ලංකා රජයට සහ HDL සමාගමට එරෙහිව වංචා සිදුකල පදනම මත, පුද්ගලයින් 4 දෙනෙකුට එරෙහිව චෝදනා පත්‍ර නිකුත් කරන ලදී. ඉන් එක් චෝදනාවක් වුයේ HDL සමාගමේ වාර්ෂික ගිණුම් වලට අදාළවය. එනම්:

"අධ්‍යක්ෂ මණ්ඩලයේ අවධානයට යොමු කරනු ලැබූ විෂමතා, අඩුපාඩු සහ අක්‍රමිකතා නොසළකා හරිමින් සහ HDL සමාගමේ 1990.3.31 දිනට අවසන් වර්ෂය සඳහා වාර්ෂික ගිණුම් වැරදිසහගතව ලෙස සත්‍ය වාර්තාවක් වශයෙන් අනුමත කිරීමට උත්සාහ කර ඇත්තේ ඉහත වංචනික ක්‍රියාවන් සහ පැහැර හැරී යටපත් කිරීමේ අරමුණිින්ය"

18. අමරසේකර විසින් විශේෂ ජනාධිපති කොමිසම ඉදිරියේ සාක්කි දෙමින් සිදු කරනු ලැබූ හෙළිදරව් කිරීම් අනුව, පසුව මිට්සුයි සහ තායිසෙයි සමාගම් විසින් කලින් ස්ථාපිත කල පරිදි නොව, එනම් කපා නොහැරිය ශේෂය සඳහා රජය වෙතින් නොව ඒ වෙනුවට HDL සමාගම වෙතින් පොරොන්දු පත්‍ර ලබා ගැනීමට එකඟ වෙමින්, මෙම බේරුම්කරණය කඩිනමින් සිදු කර දෙන ලෙසට මහා භාණ්ඩාගාරයේ ලේකම් ඒ. එස්. ජයවර්ධනගෙන් ඉල්ලා සිටින ලදී.

19. එවැනි තත්ත්වයක් තුල, අමරසේකර විසින් තවදුරටත් මිට්සුයි සහ තායිසෙයි සමාගම් සමඟ සාකච්ඡා කොට, **1993 ජූනි මාසයේදී සිදු කරනු ලැබූ සාකච්ඡාවන්ට සාපේක්ෂව සන්සන්දනය කිරීමේදී,** 1995 **ජූනි මාසයේ දී වර්ෂ දහයක් සඳහා උපචිත පොලිය සහ 30 % ක ප්‍රාග්ධනය කපා හැරීමට සහ කපා නොහරින ලද ඉතිරි ශේෂය වූ එක්සත් ජනපද ඩොලර් මිලියන 120 ක්, ඉදිරි වර්ෂ 16 ක් දක්වා, 5.25 % ක වාර්ෂික පොලී අනුපාතයක් මත, කොටස් වශයෙන් ගෙවීමට දීර්ඝ කිරිමට මිට්සුයි සහ සමාගම සහ තායිසෙයි සමාගම එකඟ කර ගන්නා ලදී.**

20. මේ අනුව, අමරසේකරගේ බලපෑම මත, මිට්සුයි සහ තායිසෙයි සමාගම් විසින් ඉහත **කපා හරින** ලද වංචාසහගත හිමිකම් වටිනාකම රාජ්‍ය ඇපකරයන්ගෙන් **62% ක්** වූ අතර, එය1995 ජූනි මසට ජපන් යෙන් මිලියන 17,586 ක්, එවකට ඇමරිකානු ඩොලර් මිලියන 207 ක් හෝ **ශ්‍රී ලංකා රුපියල් මිලියන 10,200 කි**. එය **2016.12.31** දිනට ඉහත කපා හැරීම් මහා බැංකුවේ තැන්පත් පොලී අනුපාතය අනුව වටිනාකම **රුපියල් මිලියන 89,927.6 ක්** වන අතර, එලෙසම නැවත කොටස් වශයෙන් ගෙවීම දීර්ඝ කරනු ලැබූ ඉතිරි ශේෂයේ **2016.12.31** දිනට වටිනාකම **රුපියල් මිලියන 51,884.7 කි**.

**21.** මෙයට අමතරව, කපා නොහරින ලද ඉතිරි ශේෂය **ඉදිරි වර්ෂ 16 ක් දක්වා 5.25 % ක අඩු කල වාර්ෂික පොලී අනුපාතයක් මත කොටස් වශයෙන් ගෙවීම දීර්ඝ කරන ලදී.**

22. **අමරසේකර විසින් ඇතිකර දුන් ඉහතකී නීතිමය ගිවිසුම් මත,** රජය ඇපකරු ලෙස විශාල ප්‍රතිලාභයක් ලබා ගෙන තිබුණු බවට රජය එම ගිවිසුම් වලින් පිළිගෙන ඇත.

23. මීට පෙර 1993 ජූනි මාසයේ දී කෙටුම්පත් කර තිබුණ ලෙසම එම ගිවිසුම් 1995.6.28 දින රජය, මිට්සුයි සහ තායිසෙයි සමාගම්, HDL සමාගම සහ අමරසේකර අතර අත්සන් කරන ලද්දේ, පහතින් සඳහන් 1993 ජූනි මස වූ මූලික කෙටුම්පත් ඉහත සඳහන් පරිදි වැඩි දියුණු කර, ගරු. නීතිපති ජනාධිපති නීතිඥ ෂිබ්ලි අසීස් වෙනුවෙන් සොලිස්ටර් ජනරාල් ජනාධිපති නීතිඥ ඩග්ලස් ප්‍රේමරත්න විසින් අනුමත කල පසු සහ එය විශේෂ ජනාධිපති කොමිෂම සහ අමාත්‍ය මණ්ඩලය විසින්ද අනුමත කිරිමෙන් පසුවය.

24. අමරසේකර විසින් ඉහත සඳහන් ඔහුගේ නීතිමය ව්‍යුත්පන්න නඩු දෙක ඉවත් කර ගැනීමට <u>**ප්‍රථම**</u>, ශ්‍රී ලංකා රජය, මිට්සුයි සහ සමාගම සහ තායිසෙයි සමාගම සහ HDL සමාගම අතර වූ ගිවිසුම් වල **'පූර්ව කොන්දේසි'** වශයෙන් කොන්දේසි කිහිපයක් ඉහත අත්සන් කල ගිවිසුම් වල අඩංගු කර තිබුණි.

25. දිස්ත්‍රික් අධිකරණය, අධ්‍යක්ෂකවරුන් වෙත, විශේෂයෙන්, පා. ම. ජනාධිපති නීතිඥ කේ. එන්. චොක්සිව බෙදජනක ලෙස හෙළා දැක කියා සිටියේ 'සමාජයේ දරණ තත්වය ප්‍රයෝජයනට ගනිමින් බලපෑම් ඇති කිරීමට පවා සමත් පුද්ගලයින් එම බලය යොදා ඉදිකිරීම් වල නිවැරදිභාවය පිළිබඳ තහවුරු කර ගැනීම වැළැක්වීම සඳහා මැදිහත් වී, කෙසේ හෝ උත්සහ ගෙන තිබුණේ මිට්සුයි සහ තායිසෙයි සමාගම් වලට මුළු ගෙවීම් කිරීමටය. මෙය වංචනික ලෙස සහයෝගයෙන් ක්‍රියා කිරීමේ අවස්ථාවකි'.

26. ඉන් අනතුරුව, නීතිපති, ජනාධිපති නීතිඥ ටී. ජේ. මාරපන අතිරේක සොලිස්ටර් ජනරාල් ජනාධිපති නීතිඥ ෂිබ්ලි අසීස් මගින් අභියාචනාධිකරණයේදී පෙනී සිට, හාත්පසින්ම වෙනත් ස්ථාවරයක් ගනිමින්, අමරසේකරගේ නඩුව නිශ්ප්‍රභා කිරීමේ අභිලාශයෙන් අභියාචනාධිකරණයේදී මැදිහත් වීමට කටයුතු කරන ලද අතර, එසේ සිදු කරන ලද්දේ **මෙම පරීක්ෂණය සඳහා අතුරු තහනම් නියෝග නිකුත් කිරීම දක්වා වූ දිස්ත්‍රික් අධිකරණ විමසීම් වලට එවකට නිතිපතිතුමගේ සහභාගි වීමක් පවා නොතිබුන අතරය.**

27. ඉන් අනතුරුව, ඉහත ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චය ලබා දීමෙන් පසුව, දිස්ත්‍රික් අධිකරණය විසින් පිළිතුරු ලබා දිය යුතු බවට නියෝග කර මිට්සුයි සහ සමාගම සහ තායිසෙයි සමාගම වෙත ඉදිරිපත් කරනු ලැබූ විචාරණවලට පිළිතුරු සැපයීමට අපොහොසත් වීම මත, මිට්සුයි සහ තායිසෙයි සමාගම් විසින් මහා භාණ්ඩාගාරයේ ලේකම් ආර්. පාස්කරලිංගම් හරහා බේරුම්කරණයකට ඉල්ලීම් කරනු ලැබ, එම අවස්ථාව වන විට ජපාන් රජය ශ්‍රී ලංකාවේ විශාලතම ආධාර සපයන්නා යන හේතුව මත, ඒ සඳහා එකඟ වන ලෙස ආර්. පාස්කරලිංගම් විසින් අමරසේකරගෙන් අයැද සිටින ලදී.

28. ඉන්පසුව අමරසේකර සහ ඔහුගේ නීතිඥ ජනාධිපති නීතිඥ කේ. කනග්-ඊශ්වරන් විසින් මහා භාණ්ඩාගරය සහ නීතිපති දෙපාර්තමේන්තුව සමඟ පැවති සාකච්ඡා වලින් අනතුරුව, අමරසේකරගේ නඩු මහාපරිමාණ වංචාවක් මත බව තහවුරු වුණි.

29. ඉන් අනතුරුව බේරුම්කරණයකට පැමිණීම සඳහා වූ අමරසේකරගේ බල කිරීම මත, **මිට්සුයි සහ තායිසෙයි සමාගම් විසින් 1993 ජුනි මසදී හිල්ටන් හෝටලය ඉදි කිරීමේදී ලබා දුන් ණයෙහි අවුරුදු 8 කට එකතු වී තිබූ පොලිය සහ ප්‍රාග්ධනයෙන් 30 % කපා හැරීමටත් සහ කපා නොහැරිය ඉතිරි ණය ශේෂය කොටස් වශයෙන් ගෙවීමට තවත් වර්ෂ 13 ක් දක්වා වාර්ෂික පොළී අනුපාතය 5.9 % ක් යටතේ දීර්ඝ කිරීමට එකග වී ඇත.**

30. අමරසේකර සහ ඔහුගේ නීතිඥ ජනාධිපති නීතිඥ කේ. කනග්-ඊශ්වරන් විසින් ගරු නීතිපති ජනාධිපති නීතිඥ ටි. ජේ. මාරපන සහ මහා භාණ්ඩාගාර ලේකම් ආර්. පාස්කරලිංගම් සමඟ තවදුරටත් සාකච්ඡා පැවැත්වීමෙන් පසුව, ඔවුන්ගේ උපදෙස් මත, ගරු. නීතිපති ජනාධිපති නීතිඥ ටි. ජේ. මාරපන සමඟ එක්ව අතිරේක සොලිස්ටර් ජනරාල් ජනාධිපති නීතිඥ ඒ. එස්. එම්. පෙරේරා විසින් 1993 ජුනි මසදී, බේරුම්කරණය සඳහා ගිවිසුම් කෙටුම්පත් කර, ඉදිරිපත් කරන ලදී.

31. ඉහත කාර්යයන් භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම් කේ. ෂන්මුගලිංගම් විසින් සම්බන්ධීකරණය කර තිබූ අතර, බේරුම්කරණය සඳහා වූ ගිවිසුම් කෙටුම්පතෙහි පිටපත් මහා භාණ්ඩාගාරය විසින් අමරසේකර වෙත ඔහුගේ පරීක්ෂණය සඳහා ඉදිරිපත් කර තිබුණි.

32. ජනාධිපති ආර්. ප්‍රේමදාස මහතාගේ ඛේදජනක අභාවය හේතුවෙන් සහ භාණ්ඩාගාර ලේකම් ආර්. පාස්කරලිංගම් විදේශගත වීමෙන් ඉහත කෙටුම්පත් ගිවිසුම් අවසන් නිගමනයකට නොඑලඹුනේ විශේෂයෙන්ම මිට්සුයි සහ තායිසෙයි සමාගම් විසින්, **ඔවුන් වෙත මේ වන විටත් ලබා දී ඇති රාජ්‍ය ඇපකරයන්ට අමතරව,** කපා නොහැරිය ඉතිරි ණය ශේෂය ගෙවීම සඳහා රජයෙන් පොරොන්දු පත්‍රද ඉල්ලා සිටීමය.

33. සත්‍ය වශයෙන්ම, ශ්‍රේෂ්ඨාධිකරණය විසින් අදාළ විනිශ්චය ලබා දීමට සති කීපයකට පෙර, රිවඩ් ද සොයිසා පැහැරගෙන ගිය බව කියන සහකාර පොලිස් අධිකාරී රොනී ගුණසිංහ, මේ දක්වා තවමත් ජීවත් වන අමරසේකර හොඳින් දන්නා පුද්ගලයකු හරහා අමරසේකරව හමු වී ඇත.

34. අමරසේකරගේ නඩු හේතුවෙන් රජය අපහසුතාවයකට පත්ව සිටින බැවින්, අමරසේකරගේ ජීවිතය අවදානමකට ලක් කර ගනිමින් සිටින බව සැඟවුනු තර්ජනයක් සේ සඳහන් කරමින්, එබැවින් අමරසේකර විසින් මෙම හිල්ටන් හෝටලය සම්බන්ධ නඩු අතහැර දැමිය යුතු බවට සුහදව මත්පැන් ගනිමින් සිටියදී සහකාර පොලිස් අධිකාරී රොනී ගුණසිංහ විසින් යෝජනා කරන ලදී.

35. මරණය ජීවිතයේ නිශ්චිත ඉරණම වන බවට අමරසේකර ඒ මොහොතේම පිළිතුරු දෙමින්, එය සහකාර පොලිස් අධිකාරී රොනී ගුණසිංහ හෝ වෙනත් කවරකුගේ වෙඩි පහරකින් හෝ වේවා, තමන් විසින් තෝරාගත් මාර්ගයේ ගමන් කරන බව පවසා ඇත. එම ඍජු පිළිතුරට සහකාර පොලිස් අධිකාරී රොනී ගුණසිංහ තුෂ්නිම්භූත වී ඇත. ඉන් ටික කලකට පසුව, 1993 මැයි 1 වන දින ජනාධිපති ආර් ප්‍රේමදාස ඝාතනය කල ඛේදජනක ත්‍රස්තවාදී බෝම්බයට හසුව සහකාර පොලිස් අධිකාරී රොනී ගුණසිංහද මිය ගියේය.

36. **මුල් ගෘහ නිර්මාණ සැලැස්මෙහි හරස්කඩ පත්‍රයන් වෙනුවට අදාළ මාලයන්හි නව 'උන්නතාංශයන්' ඇතුලත් කර සැකසූ නව හරස්කඩ පත්‍රයන් ආදේශ කර** සහ එම මුල් ගෘහ නිර්මාණ සැලැස්මෙහි මහල් දෙකක සහ බිම් මහලෙහි අදාළ පත්‍රයන් සම්පූර්ණයෙන්ම ඉවත් කරනු ලැබ ඇති බව, විශේෂ ජනාධිපති කොමිසම ඉදිරියේ කිසිඳු සාධාරණ සැකයකින් තොරව ඔප්පු වී තිබුණි.

37. මුල් බිම් සැලසුම් පත්‍රයන්හි දක්වා ඇති 'උන්නතාංශයන්' නව හරස්කඩ පත්‍රයන්හි නිරූපණය කර ඇති අදාල මහල් වල 'උන්නතාංශයන්' සමඟ නොගැලපි තිබීම **මුල් ගෘහ නිර්මාණ සැලසුම් සාපරාධි ලෙස කඩාකප්පල් කිරීමක් බව බිඳලිය නොහැකි සාක්ෂි මගින් තහවුරු විය.**

**38. එවැනි කඩාකප්පල්කාරීකම මත, පිළිවෙලින් 3 වන සහ 4 වන මහලෙහි 'උන්නතාංශයන්' මීටර් 24.5 ක් සේ සමාන අගයක සහ 19 වන මහල හා 19 වන මහලෙහි වහලයේ 'උන්නතාංශයන්' පිළිවලින් මීටර් 72.7 ක් සහ මීටර් 72.5 වශයෙන් පෙන්නුම් කිරීමෙන්, _වහල 19 වන මහලට පහළින් පිහිටා ඇති බව පුදුමාකාර ලෙස දක්වා ඇත !_**

39. ඉහත එළිදරව් වූ බිඳලිය නොහැකි සාපරාධී සාක්ෂි අනාවරණය වීම මත විශේෂ ජනාධිපති කොමිෂම කියා සිටියේ මෙවැනි ගෘහ නිර්මාණ සැලසුම් **නෛසර්ගික, ආවේණික, සිදු විය නොහැකි** දෙයක් ලෙස සහ නාගරික සංවර්ධන අධිකාරියට එය අනුමත කිරීමට කිසිසේත්ම හැකියාවක් නොතිබුණ බවත්ය !

40. **මහල් සැලසුම් පත්‍රයන්හි දක්වා ඇති 'උන්නතාංශයන්' මුල් ව්‍යාපෘති සැලැස්මේ හරස්කඩ පත්‍රයන්හි අදාල මහල්වල 'උන්නතාංශයන' සමඟ ඍජුව ගැලපෙන බැවින්, මුල් ගෘහ නිර්මාණ සැලසුම් අනිවාර්යයෙන්ම සාපරාධී ලෙස කඩා කප්පල් කර ඇති බවට මෙයින් සැබෑ ලෙස මනාව ස්ථාපිත විය.** ගෘහ නිර්මාණ සැලසුම් වල **බිම් මහල් වල පත්‍රිකා ඉවත් කර තිබුණි. විශේෂ ජනාධිපති කොමිෂම මේ පිළිබඳව ප්‍රශ්න කිරීමේදී HDL සමාගමේ සභාපති සහ කළමනාකරණ අධ්‍යක්ෂක සී. එල්. පෙරේරාගේ නීති උපදේශක වූ නීතිඥ එස්. සී. ක්‍රොසෙට් තම්බයියා හට <u>ඒ මත කිසිදු පැහැදිලි කිරීමක් කිරීමට නොහැකි බව පවසන ලදී</u>.**

41. විශේෂ ජනාධිපති කොමිෂම ඉදිරියේ අමරසේකර විසින් ඉදිරිපත් කරනු ලැබූ ඉහත සාක්ෂි මත හරස් ප්‍රශ්න ඇසීම සඳහා අවස්ථාව ලබා දෙමින්, ජපාන ගෘහ නිර්මාණ ශිල්පී කැන්කෝ කිකාකු සෙක්කෙෂියා යොෂෝ ෂිබාටා සමාගම වෙනුවෙන් පෙනී සිටි ජනාධිපති නීතිඥ එල්.සී. සෙනවිරත්නව විශේෂ ජනාධිපති කොමිෂම විසින් එසේ කිරීමට නැවත නැවතත් උනන්දු කර සිටියත්, ඔහු අමරසේකරගෙන් ඉහතකී සාක්ෂි මත හරස් ප්‍රශ්න නොඅසන ලදී. **ඉන්පසුව ජනාධිපති නීතිඥ එල්.සී. සෙනවිරත්න ජපන් ගෘහ නිර්මාණ ශිල්පීන් වෙනුවෙන් පෙනී සිටීමෙන් ඉවත් වී ඇත.**

42. **ඉන්පසුව, තමන් විසින් කල එම වැරැද්ද ඍජුව පිළිගත් නාගරික සංවර්ධන අධිකාරියට ඇත්ත වශයෙන්ම ඉදි කල හිල්ටන් හෝටලයේ මිනුම් අනුව නව ගෘහ නිර්මාණ සැලසුම් සකස් කිරීමට සිදු විය.**

43. හිල්ටන් හෝටල් ව්‍යාපෘතිය ගොඩනැගීමේ අදාල කාර්යාලයේ ඇති වූ පුදුම සහගත ගින්නක් සහ ඒ මත ව්‍යාජ ලෙස ගොතනු ලද පොලිස් වාර්තාවක්ද සහිතව කරුණු ඉදිරිපත් වීමෙන්, අදාළ ස්ථානයේ පැවති ගෘහ නිර්මාණ සැලසුම්ද ඇතුලුව සැපයුම් කොන්ත්‍රාත්තුවේ මුල් ලේඛන සියල්ල අතුරුදහන් වීමෙන් **හිල්ටන් හෝටලය නිමාකිරීමේ** ගුණාත්මකභාවය, උපකරණ පිරිවිතර, සවිකිරීම් යනාදිය පවා තහවුරු කර ගැනීමට නොහැකි විය.

44. රජය විසින් සිදු කිරීමට උත්සාහ දැරූ ඉහත බේරුම්කරණයට කොනල් සහ සමාගම විසින් විරෝධතා දක්වමින්, ඒ අනුව ඉහතින් සඳහන් අමරසේකරගේ ව්‍යුත්පන්න නඩු දෙකට එරෙහිව මූලික නඩු කිහිපයක් ගොනු කරනු ලැබීය. මෙමගින් ඉහතකී ගිවිසුම් ක්‍රියාත්මක කිරීම ප්‍රමාද විය.

45. කෙසේ වෙතත්, ඉහතකී මූලික නඩු නිෂ්ප්‍රභා කිරීමත් සමගම සහ ඉහතින් සඳහන් පරිදි මුල් ගෘහ නිර්මාණ සැලසුම් වෙනස් කර ඇති බවට බිඳලිය නොහැකි සාපරාධී සාක්ෂි 1996 මැයි මස විශේෂ ජනාධිපති කොමිෂම ඉදිරියේ හෙළිදරව් වීමෙන් පසු, **1996 නොවැම්බර් මස පැවැත්වීමට නියමිතව තිබූ ශ්‍රී ලංකා ආධාර කණ්ඩායම් රැස්වීම පැවැත්වීමට <u>ප්‍රථම</u> 1996 සැප්තැම්බර් මසදී වහාම මෙම බේරුම්කරණය සිදු කර ගැනීමට ජපාන් රජයට අවශ්‍ය බව දැනුම් දෙමින්, එසේ නොවුයේ නම්, <u>ඇමරිකානු ඩොලර් මිලියන 275 ක ජපන් ආධාර මුදා නොහරින බවට තර්ජනය කරනු ලැබීය.</u>**

46. ජපාන රජය විසින් සිදු කරනු ලැබූ ඉහතකී තර්ජනයන්හි සාක්ෂි මහා භාණ්ඩාගාරයේ ලේකම් බී. සී. පෙරේරා විසින් සහ භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම් පී. බී. ජයසුන්දර විසින් අමරසේකරට පෙන්වා දෙමින්, ජනාධිපතිනි චන්ද්‍රිකා කුමාරතුංගගේද මැදිහත්වීමෙන්, **මෙම ව්‍යුත්පන්න නඩු දෙක ඉල්ලා අස්කර ගන්නා ලෙසට** ඔවුන් විසින් අමරසේකරගෙන් දැඩි ලෙස අයැද සිටින ලදී.

47. ගරු නීතිපති, ජනාධිපති නීතිඥ සරත් එන් සිල්වා විසින් ඉහත ගිවිසුම් අනුමත කිරීමෙන් අනතුරුව, මහා භාණ්ඩාගාර ලේකම් බී. සී. පෙරේරා සහ ගරු නීතිපති, ජනාධිපති නීතිඥ සරත් එන් සිල්වාගේ බැගපත් ඉල්ලීම මත, මෙම ගිවිසුම් වල එක් කොන්දේසියක් පමණක් ඉවත් කිරීමට අමරසේකරගෙන් ඉල්ලා සිටින ලදී. එම කොන්දේසිය අධිකරණ අමාත්‍ය ජී. එල්. පීරිස් ශ්‍රී ලංකා විනිමය සහ සුරැකුම්පත් කොමිෂන් සභාවේ හිටපු සාමාජිකයකු වශයෙන් රාජකාරි පැහැර හැරීම් මත, ඔහු වෙත පෞද්ගලිකව අහිතකර ලෙස බලපාන කොන්දේසියක් වීමය.

48. කාලය සීමිත වීම හේතුවෙන්, මහා භාණ්ඩාගාර ලේකම් බී. සී. පෙරේරා සහ භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම් පී. බී. ජයසුන්දර අමරසේකර සමඟ මැදිහත්ව කටයුතු කරමින්**,** අමරසේකරට ඔහුගේ නඩු දෙක ඉල්ලා අස්කර ගැනීමට **පූර්වයෙන්** සම්පූර්ණ කල යුතුව තිබූ, **'පූර්ව කොන්දේසි'** සම්පූර්ණ කිරීමට **ප්‍රථම**, ඔහුගේ නඩු දෙක ඉල්ලා අස්කර ගැනීමට එකඟ වන ලෙස ඔහුගෙන් බැගැපත්ව අයැද සිටින ලදී.

49. **ඔවුන් ගරු ගාම්භීර ලෙස පොරොන්දු වෙමින් මෙම 'පූර්ව කොන්දේසි' 'පසු කොන්දේසි' වශයෙන් ඉටු කිරීමට වගකීමෙන් භාර ගන්නා ලදී.**

50. රජයේ බැගැපත් අයැදීම් හමුවේ අමරසේකර **නැවත වරක් එකඟතාවය පළ කරමින්**, ගිවිසුමෙහි සඳහන් **'පූර්ව කොන්දේසි' 'පසු කොන්දේසි'** වශයෙන් සංශෝධනය කිරීමට එකඟ වීමෙන්, ඒ අනුව ගරු නීතිපති සරත් එන්. සිල්වා සහ මහභාණ්ඩාගාර ලේකම් බී. සී. පෙරේරා විසින් 'පූර්ව කොන්දේසි' 'පසු කොන්දේසි' වශයෙන් වන පරිදි පරිවර්තනය කරමින් ඉහත ගිවිසුම්වලට සකස් කරනු ලැබූ **පරිශිෂ්ටය**, 1996 සැප්තැම්බර් / ඔක්තෝබර් මසදී රජය, අමරසේකර සහ මිට්සුයි සහ තායිසෙයි සමාගම් අතර අත්සන් කරන ලදී.

51. අමරසේකරගේ බල කිරීම මත, ඉහත **පරිශිෂ්ටය** මගින් මිට්සුයි සහ තායිසෙයි සමාගම් විසින් **'පූර්ව කොන්දේසි' 'පසු කොන්දේසි'** වශයෙන් සම්පූර්ණ කිරීමට ඔවුන්ගේ කොටස් මත අවලංගු කල නොහැකි ඡන්ද අයිතිය මහා භාණ්ඩාගාර ලේකම් වෙත ලබා දී ඇත. වෙනත් දේ අතර, **පරිශිෂ්ටයේ** පහත සඳහන් පරිදි ප්‍රධාන වශයෙන් වාර්තා කොට ඇත.

> **"ශ්‍රී ලංකා රජයට කිසිම බාධාවක් නොමැතිව ජපන් රජය සමඟ සුහද සබඳතා පවත්වා ගෙන යැමට අවශ්‍ය බැවින් රජයද එම ඉහතකී ගිවිසුම් ක්‍රියාත්මක කිරීම ප්‍රමාද වීම ගැන සැලකිලිමත් වී ඇත.**
>
> මෙම තත්වය තුල, රජය, **අමරසේකරගේ කැමැත්ත සහ එකඟතාවය මත,** දැන් එකගවී ඇත්තේ ගිවිසුම් අංක 3 සහ 4 හි නියම කර ඇති කොන්දේසි සම්පූර්ණ කිරීමට පෙර, ගිවිසුම් අංක 1 සහ 2 හි කොන්දේසි ක්‍රියාත්මක කර ගෙන යාම සඳහා එකඟ වීමය. **රජය විසින්, ගිවිසුම් අංක 3 සහ 4 යටතේ ඇති කොන්දේසි ක්‍රියාත්මක කිරීමට අදාල නීති අනුව පරිපාලනමය වශයෙන් කටයුතු කිරීමට රජය වගකීමෙන් බැඳී සිටියේය."**

52. ඒ අනුව, HDL සමාගමේ අධ්‍යක්‍ෂක මණ්ඩල රැස්වීමේදී ඉහතකී ගිවිසුම් වලට සහ <u>පරිශිෂ්ටය</u> බලාත්මක කිරීමට තීරණය කර, මුලසුන හෙබවූ භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම් පී. බී. ජයසුන්දර පහත සඳහන් පරිදි ප්‍රකාශ කර වාර්තා කොට ඇත:

> **"<u>සභාපති වූ ආචාර්ය පී. බී. ජයසුන්දර මුලින්ම කියා සිටියේ මෙම මණ්ඩල රැස්වීම පවත්වනු ලබන්නේ, රජයේ න්‍යාය පත්‍රයට අනුව, ජාතික වැදගත්කමක් ඇති ප්‍රශ්නයක් වන ශ්‍රී ලංකාව සහ ජපානය අතර මිත්‍රශීභාවය ඉදිරියට ගෙන යාමට රජය ඔහුට දුන් නිර්දේශයක් අනුව බවත්, ඒ අනුව අනෙක් අධ්‍යක්ෂවරුන්ගෙන් ඉල්ලා සිටියේ රැස්වීම</u> ඔවුන් ඉදිරියේ ඇති න්‍යාය පත්‍රය අනුව පැවැත්වීමටය. අනිකුත් සියළු දෙනා එකඟ විය"**

53. ඉහත <u>පරිශිෂ්ටය</u> **<u>1996.10.21</u>** දින අත්සන් කරන ලද අතර, අමරසේකරගේ **ව්‍යුත්පන්න** නඩුදෙක **<u>1996.10.23</u>** දින ඉහත ගිවිසුම් මත සමථයකට පත් කර ඉල්ලා අස්කර ගන්නා ලද අතර, HDL සමාගමේ අධ්‍යක්‍ෂක මාණ්ඩලික රැස්වීම **<u>1996.10.25</u>** දින පැවති අතර, අමරසේකර විසින් ලබා ගත් අතුරු තහනම් නියෝගය හේතුවෙන්, HDL සමගමේ එකතු වී තිබූ අරමුදල වන **ඇමරිකානු ඩොලර් මිලියන 30** භාවිතා කරමින් මිට්සුයි සහ සමාගම සහ තායිසෙයි සමාගම යන ජපන් සමාගම් වෙත ගෙවීම් **<u>1996.10.28</u>** දින සිදු කරන ලදී. *අමරසේකර විසින් **<u>ඉතාමත් කඩිසර ලෙස රජයේ එම බැරෑරුම් හදිසි අවශ්‍යතාවයන් ඉටු කිරීමට මනා සහයෝගයෙන් කටයුතු කළ බව පිලිඹිබු වූ අතර, එලෙසම රජයද ඒ අනුව සද්භාවයෙන් කටයුතු කරනු ඇතැයි අමරසේකර තරයේ විශ්වාස තබා ඇත.</u>***

53. **රජය විසින් අමරසේකරගෙන් බැගැපත්ව ඉල්ලා සිටි පරිදි, ඔහුගේ එම ව්‍යුත්පන්න නඩුදෙක සමථයකට පත් කර ඉල්ලා අස්කර නොගත්තේ නම්, ඔහුට මෙම ව්‍යුත්පන්න නඩුදෙක තවදුරටත් වර්ෂ කිහිපයක් පුරා දිගටම පවත්වා ගෙන යැමෙන් විශේෂ ජනාධිපති කොමිසම ඉදිරියේ සාර්ථකව ඔප්පු කළ පරිදි අධිකරණයේද සාර්ථකව ඔප්පු කිරීමේ හැකියාව තිබුණු අතර, HDL සමාගමේහි එකතු වී තිබූ ඇමරිකන් ඩොලර් මිලියන 30 ක මුදල තවදුරටත් වැඩි කර ගැනීමටද තිබුණි.**

55. ඒ අනුව, අමරසේකරහට **<u>අවසාන අධිකරණ නියෝගය</u>** ලෙස ලැබීමට තිබුනේ මිට්සුයි සහ තායිසෙයි ජපන් සමාගම් වෙත අධිකරණයෙන් ඉල්ලා සිටි පරිදි කිසිම මුදලක් නොගෙවීමටය. ඒ අනුව **<u>HDL සමාගමේ ඉහතකී ලෙස එකතු කර ගැනිමට තිබූ මුදල මගින් ඇමරිකන් ඩොලර් මිලියන 125 හෝ ඊට වැඩි ප්‍රමාණයක්</u>** වීමට තිබුණි.

56. ඉන් අනතුරුව මිට්සුයි සහ තායිසෙයි ජපන් සමාගම් සමඟ සාකච්ඡා කර පියවීම සඳහා වන කපා නොහැරිය ණය වටිනාකම ඇමරිකානු ඩොලර් මිලියන 120 තවත් අඩුකර ගෙන එය සම්පූර්ණයෙන් ඔවුනට ගෙවා **<u>ඒ අනුව රජයේ ඇපකර අවලංගුවීම හේතු කොට ගෙන රජයට HDL සමාගම සමග කිසිම බැදීමක් නොතිබෙන්නට තිබුණි</u>**.

57. **අමරසේකර විසින් ප්‍රකාශ කර සිටින්නේ, <u>රජයේ අයදීම්වලට ඉහත කී ලෙස අවනත වී ක්‍රියා නොකර සිටියේ නම්</u>, මිට්සුයි සහ සමාගම සහ තායිසෙයි සමාගම වෙත සම්පූර්ණ ණය ගෙවීම මත, ලබාදී තිබූ රාජ්‍ය ඇපකර අවලංගු වීමෙන්, අද දින HDL සමාගමේ වර්තමාන ප්‍රධාන කොටස්කරුවෙකු වන්නේ, අන් අය අතර, අමරසේකර බවත් ශ්‍රී ලංකා රජය නොවන බවත්ය.**

58. **<u>ඉහතකි ලෙස එය අමරසේකර සතුව පැවති තනි බලය මත ගත හැකිව තිබූ හොඳම සහ නිවැරදිම ව්‍යාපාර තීරණය විය හැකිව තිබූ බවත්ය.</u>** නමුත් ඔහු රජයේ අයදීම්වලට සවන් දෙමින් සහ අවනත වෙමින් රටේ යහපත වෙනුවෙන් ක්‍රියා කරනු ලැබූවේ *එවකට ශ්‍රී ලංකාවේ විශාලතම ආධාරකරු වූ ජපාන් රජය වීම මත, ශ්‍රී ලංකා ආධාර රැස්වීමට පෙර ජපාන් රජය විසින් ශ්‍රී ලංකා රජය වෙත සිදු කල තර්ජනාත්මක බලපෑම් හේතු කොට ගෙන* ශ්‍රී ලංකා රජයට ඇතිවූ එම දුෂ්කර තත්වය මත, *එමගින් ඔහුගේ එම වටිනා අයිතිය අතහැරීමෙන්,* ශ්‍රී ලංකා රජයේ බැගපත් ඉල්ලීම් වලට අවනත විමට ඔහුට සිදුවීය.

59. ඉන් අනතුරුව, ජනාධිපති චන්ද්‍රිකා කුමාරතුංග විසින් පසුව අමරසේකර දැනුවත් කල පරිදි, රජයට එරෙහි වංචා කිරීම මත, විශේෂ ජනාධිපති කොමිෂම විසින් චෝදනා ලැබූ HDL සමාගමේ අධ්‍යක්ෂවරයකු වූ පාර්ලිමේන්තු මන්ත්‍රී ජනාධිපති නීතිඥ කේ. එන්. චොක්සි විසින් අධිකරණ අමාත්‍ය ජී. එල්. පීරිස් සමග ඇය හමුවීමට පැමිණ එවකට ජනාධිපති චන්ද්‍රිකා කුමාරතුංග විසින් සකස් කරමින් තිබූ 2000 අගෝස්තු මස අසාර්ථකවූ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කෙටුම්පතට එක්සත් ජාතික පක්ෂයේ සහයෝගය අනිවාර්යයෙන්ම ලබා දෙන බවට සහතික වීම නිසා, ඇය විසින් එම අවස්ථාවේදී විශේෂ ජනාධිපති කොමිෂමේ වරෙන්තු දීර්ඝ නොකිරීමට තීරණය කල බවය.

60. නමුත් ඉන්පසුව එම තීරණය පිළිබඳ කණගාටුව ප්‍රකාශ කරමින්, ජනාධිපති චන්ද්‍රිකා කුමාරතුංග විසින් වහාම පොලිස්පති වෙත නියෝග කරන ලද්දේ ගරු නීතිපති ජනාධිපති නීතිඥ කේ. සී. කමලසබේසන් විසින් උපදෙස් ලබා දී තිබූ පරිදි, කොළඹ හිල්ටන් හෝටලයේ ඉදිකිරීම් පිළිබඳ වංචාව සම්බන්ධයෙන් වහාම විමර්ශනය කර අදාළ වගකිවයුතු පුද්ගලයින්ට එරෙහිව නිතිමය ක්‍රියාමාර්ග ගන්නා ලෙසය.

61. ඒ අනුව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් එම විමර්ශන ආරම්භ කර තිබුණත්, ඔවුන්ගේ එවැනි විමර්ශන අධීක්ෂණය කරමින් සිටි නීතිපති දෙපාර්තමේන්තුව විසින් එම විමර්ශන කිරීම වළක්වාලන ලදී.

62. මිට අමතරව, පහත සඳහන් පරිදි අමරසේකර විසින් වටිනා දායකත්වයක් ලබා දී තිබුණි.

i) මිට්සුයි සහ සමාගම සහ තායිසෙයි සමාගම වෙත නිකුත් කරනු ලැබූ රාජ්‍ය ඇපකරයන්ට අමතරව, HDL සමාගම හොර රහසේ කොළඹ හිල්ටන් හෝටලය සහ නාගරික සංවර්ධන අධිකාරියේ ඉඩම් උකස් කිරිමට තැත් කිරීම 1989 දී ඔහු විසින් වලක්වාලන ලදී.

ii) නාගරික සංවර්ධන අධිකාරිය සතු ඉඩම්හි කල් බදු නිශ්ප්‍රභා කිරීමට රජයට සහාය දැක්වූ අතර, 1999 ජූලි මස ක්‍රියාත්මක කරන ලද විශේෂ ප්‍රදාන පත්‍රයන් මගින් එම ඉඩම් නැවත රජය වෙත ලබා ගැනීමට ඔහු විසින් දායකත්වය ලබා දී ඇත.

iii) හිල්ටන් හෝටලය ත්‍රස්ත බෝම්බ ප්‍රහාරයෙන් විනාශ වීම මත, ලද ඇමරිකානු ඩොලර් මිලියන 10 ක රක්ෂණ මුදල් හිල්ටන් ජාත්‍යන්තර සමාගමට අයත් යයි වංචනික ලෙස හිමිකම්පෑමෙන් එයින් එක්සත් ජනපද ඩොලර් මිලියන 7 ක් සඳහා නාමික අගය මත HDL සමාගමේ කොටස් ලබා දෙන ලෙසට ඉල්ලා සිටි අතර, එමගින් හිල්ටන් ජාත්‍යන්තර සමාගමේ 50.1% පාලනය කරන කොටස් ප්‍රමාණයක් ලබා ගැනීමට ගත් උත්සහය ඔහු විසින් සාර්ථක ලෙස වලක්වාලන ලදි. එසේ නොවූයේ නම් මිට්සුයි සහ සමාගම සහ තායිසෙයි සමාගම 13% කොටස් හිමිකාරීත්වය සහ එමගින් රජයේ 65% ක් වූ කොටස් හිමිකාරීත්වය 32% ක් දක්වා අඩු වීමට ඉඩ තිබුණි.

iv) HDL සමාගමේ පෙර සභාපති වූ අජිත් ඩයස් විසින් ආරම්භ කර තිබූ සාකච්ඡා අවසන් කර, නව වාසිදායක කොන්දේසි සකස් කර අවසන් කර, හිල්ටන් ජාත්‍යන්තර සමාගම සමඟ පැවති කලමනාකරණ කොන්දේසි, ඒ සඳහා 2005 ඔක්තෝබර් මස අමාත්‍ය මණ්ඩල අනුමැතිය ඇතිව, ඔවුන්ට ගෙවීම් කිරීම් අඩු කර ගැනීමට කටයුතු කරන ලදී.

v) HDL සමාගමේ අධ්‍යක්ෂක සහ සභාපති ලෙස අමරසේකර කිසිදු ගාස්තුවක් හෝ දීමනාවක් ලබා නොගත් අතර, ඔහු විසින් HDL සමාගමේ වාහනයක්ද භාවිතා නොකරන ලදී.

63. මුදල් අමාත්‍ය සරත් අමුණුගම විසින් ඉදිරිපත් කරනු ලැබූ 2005.10.5 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශය සමඟ අමාත්‍ය මණ්ඩලය විසින් පත්කල ගනුදෙනු කමිටුව විසින් ඉදිරිපත් කල වාර්තාව, අධිකරණ නියෝගයට අනුකූලව මහා භාණ්ඩාගාරයේ ලේකම් විසින් ශ්‍රේෂ්ඨාධිකරණය වෙත ඉදිරිපත් කිරීම සඳහා 2005.10.13 දිනැතිව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමැතිය ලබා දෙන ලදී.

64. එම කැබිනට් අනුමැතිය අනුව, වෙනත් දේ අතර, රජය සහ අමරසේකර විසින් ඔවුන් අතර ඇතුලත් වූ ගිවිසුම් අංක 3 හි විධිවිධාන ප්‍රකාරව පහත සඳහන් පරිදි අනුමැතිය ලබා දී ඇත.

> "රජය සහ HDL සමාගම වෙත ප්‍රතිලාභ හිමිකර දෙමින්, ජපන් යෙන් මිලියන 17,586 කට (ඇමරිකානු ඩොලර් මිලියන 207 / ශ්‍රී ලංකා රුපියල් මිලියන 10,200) ආසන්න ප්‍රමාණයක් කපා හැරීම සඳහා ගත් උත්සාහය සහ කැපවීමට HDL සමාගමේ අදාල කොටස් ප්‍රමාණයක් හෝ මූල්‍ය ගෙවීමක් රජය විසින් අමරසේකර / කොමින්ඩ්ටැක්ස් මැනේජ්මන්ට් සර්විසස් ලිමිටඩ් වෙත (වර්තමානයේ කන්සල්ටන්ස් 21 ලිමිටඩ්) වෙත ගෙවිය යුතු බව සහ 1995 ජූලි මස සිට කෝර්නල් සහ සමාගම විසින් ගොනු කිරීමට සහ ගොනු කරවාලීමට එරෙහිව රජය සහ HDL සමාගමේ අයිතීන් වෙනුවෙන් ඒවාට සහයෝගය දක්වමින් ජය ගැනීමට 1995 ජූලි මස සිට ගිය වියදම් සඳහා ඒ අනුවම ගෙවිය යුතු බවත්; රජය විසින් HDL සමාගම සහ නිහාල් අමරසේකර විසින් නඩු අංක 15322/එම්ආර් ප්‍රති ඉල්ලීම් මත පිළිවලින් ගාස්තු නොමැතිව ඉල්ලා අස්කර ගැනීම"

65. ඉන් අනතුරුව 2006 මාර්තු මාසයේ දී, භාණ්ඩාගාර ලේකම් විසින් රජය සහ අමරසේකර අතර ඇති වූ ගිවිසුම් අංක 3 හි විධිවිධාන ප්‍රකාරව ඒ අනුව වෘත්තීය වන්දි ගෙවීම නිශ්චය කිරීම සඳහා, ශ්‍රී ලංකා මර්චන්ට් බැංකුවෙහි සේවාදායකත්වය ලබා ගන්නා ලදී. එනම්:

> **"ස්වාධීන මූල්‍ය / වෙළඳ බැංකු ආයතනය / ආයතනයන් විසින් නිගමනය කල පරිදි, අමරසේකරගේ වෘත්තීයමය කාලයට සහ උත්සාහයන් වෙනුවෙන් වන්දි ගෙවීම. එය ගිවිසුම් අංක 1 නිගමනය කොට ඇති පරිදි රජය ප්‍රධාන කොටස්කරුවෙකු සහ ඇපකරු ලෙස HDL සමාගමට ලබාගත් ණය කපා හැරීම් සහ නැවත කොටස් වශයෙන් දීර්ඝ කිරීමෙන් රජයට සහ HDL සමාගමට සහ අනෙකුත් කොටස්කරුවන්ට එයින් ඇති වූ විශාල ප්‍රතිලාභය අනුව"**

66. පසුව 2006.4.24 දිනැති ශ්‍රේෂ්ඨාධිකරණ සටහන් මගින් අනාවරණය වන පරිදි අමරසේකරට ගෙවීමට තිබෙන වෘත්තීය වන්දි ස්වාධීනව තක්සේරු කිරීමට දැනටමත් පියවර ගෙන ඇති බව භාණ්ඩාගාරයේ ලේකම් විසින් ශ්‍රේෂ්ඨාධිකරණයට දන්වා සිටියේ ඉහතකී ලෙස ශ්‍රී ලංකා මර්චන්ට් බැංකුව ඒ පිළිබඳව පත්කර තිබූ බවය.

67. එහි ප්‍රතිඵලයක් වශයෙන්, ශ්‍රී ලංකා මර්චන්ට් බැංකුව විසින් ඔවුන්ගේ 2006.7.19 දිනැති වාර්තාවෙහි අනෙකුත් කරුණු අතර පහත සඳහන් මතය ප්‍රකාශ කර තිබුණි.

" **8 අපගේ මතය**

8.1 ඉහත සඳහන් කර ඇති කරුණු අනුව, අපගේ මතය වන්නේ, පහත දක්වා ඇති **විකල්ප (1)** යටතේ **එකී ජපන් යෙන් 17,586,000,000 (1995 ජූනි මස වන විට ශ්‍රී ලංකා රුපියල් 10,200,000,000)** ඉහත සඳහන් කපා හැරීමෙහි ප්‍රතිඵලය වශයෙන් රජයට සහ HDL සමාගම ලබාගත් ප්‍රතිලාභය උදෙසා, නිහාල් ශ්‍රී අමරසේකරගේ එම වෘත්තිමය සේවය වෙනුවෙන් නිහාල් ශ්‍රී අමරසේකරට / කොමින්ඩ්ටැක්ස් මැනේජ්මන්ට් සර්විසස් ලිමිටඩ් වෙත (වර්තමාන කන්සල්ටන්ට් 21 ලිමිටඩ්) **0.1% සිට 0.75%** දක්වා පරාසය තුළ වන්දි ගෙවීමක් සිදු කල යුතු බවය. පහසුව සඳහා විවිධ අනුපාත යටතේ සිදු කල වන්දි ගණනය පිළිබඳ විස්තර **ඇමුණුම (i)** හි දක්වා ඇත.

**කෙසේ වෙතත්, නිහාල් ශ්‍රී අමරසේකරගේ වටිනා සේවයන්, අනාගතයේදී රජය විසින් ඔහු සමඟ පවත්වා ගැනීමට අපේක්ෂිත සම්බන්ධතාවයන් සහ අදාළ අනෙකුත් සාධක සැළකිල්ලට ගෙන මෙම වන්දි ගෙවීම 2% ක ඉහළ අනුපාතයක් දක්වා මහා භාණ්ඩාගාරය ඔහුට ගෙවීම් කිරීමට සලකා බැලිය යුතුය. <u>එසේම මෙම වාර්තාවෙහි 6 වන වගන්තියෙහි සඳහන් කර ඇති පරිදි, වෙළඳපොළ මෙවැනි ගෙවීම් අනුව 2 % ක කොමිසමක් ගෙවීම වෙළඳපොළේ පවතින ක්‍රියාදාමයන්හි පිරිමිති වලට අනුකූල බවද ප්‍රකාශ කරමු.</u>**

8.2 **ඉහත ගෙවීමට අමතරව,** 2005 ජූලි 11 වන දිනැති අමාත්‍ය මණ්ඩලය විසින් පත්කල ගනුදෙනු කමිටුවේ යෝජනාවෙහි නිර්දේශ කර ඇති පරිදි, කෝනල් සහ සමාගම විසින් පැවරූ සහ පවරන්නට යෙදුණු නඩු වලට එරෙහිව රජය සහ HDL සමාගමේ යහපත ආරක්ෂා කිරීම උදෙසා 1995 ජූලි සිට නිහාල් ශ්‍රී අමරසේකරට / කොමින්ඩ්ටැක්ස් මැනේජ්මන්ට් සර්විසස් ලිමිටඩ් වෙත (වර්තමාන කන්සල්ටන්ට් 21 ලිමිටඩ්) දැරීමට සිදුවූ වියදම් තක්සේරු කොට ගෙවීමට යෝජනා / නිර්දේශ කරමු. "

**ඉහතකී කර්තව්‍යයේදී අමරසේකර විසින් පෞද්ගලිකව ජපාන් සමාගම් සමග කිසිදු අයුරක සාකච්ඡා සිදු කර නොමැති අතර, <u>මිට්සුයි සහ තායිසෙයි සමාගම් විසින් දැනටමත් කියාපාන පරිදි මහා භාණ්ඩාගාරය විසින් නීතිමය ක්‍රියාමාර්ග ගොණු කිරීම සඳහා අමරසේකර උනන්දු කළා යයි කියා චෝදනා කර ඇති බැවින්, ජාතික අවශ්‍යතාවයන් මත මහා භාණ්ඩාගාරයේ සම්බන්ධතාවය එළිදරව්වීම වැළැක්වීම උදෙසා සමහර ලේඛනයන්හි පිටපත් ඔහු විසින් ලබා දී නොතිබුණි.</u>**

68. ඉහතින් දැක්වෙනුයේ කොනල් සහ සමාගම විසින් ස්ථාපිත කරනු ලැබූ නඩු 8 න් 7 ක් පූර්වයෙන් ප්‍රතික්ෂේප කරනු ලැබ, අවසාන නඩුව බේරුම්කරණය කර ගැනීමට දැරූ ප්‍රයත්නයට අදාළවය. කෙසේ වෙතත්, කොනල් සහ සමාගම, රජය විසින් ඔවුන් වෙත ප්‍රදානය කර ඇති වන්දි පිළිබඳව සෑහීමකට පත් වූයේ නැත. ඉන් අනතුරුව, කොනල් සහ සමාගම විසින් ගොණු කර තිබූ අවසන් නඩුවද 2014 මැයි මාසයේ දී නිෂ්ප්‍රභා කරන ලදී.

69. **2012.6.15 වන දින සී. එල්. පෙරේරා සහ නිහාල් ශ්‍රී අමරසේකර ගිවිසුමකට ඇතුලත් වෙමින්, ඒ අනුව රජයෙන් ඔවුන් වෙත පිලිවෙලින් ලැබිය යුතු වූ අදාළ හිමිකම් ලාබා ගැනීම සහ ඒ සඳහා ලුහු බැඳ යාම වෙනුවෙන් ඔවුන්ට වෙන් වෙන්ව නිදහස්ව කටයුතු කල හැකි බවට එකගවෙමින් සහ ඔවුන් එකිනෙකාට එරෙහිව සියළු හිමිකම්පෑම් අතහැර දැමීමටත් එකගවී ඇත.** *අදාළ ගිවිසුමෙහි පිටපතක් භාණ්ඩාගාර ලේකම් වෙත ඉදිරිපත් කර ඇත.*

70. කෙසේ වෙතත්, එයින් පසුව**, <u>2013.8.5</u>** දින සහ **<u>2013.11.25</u>** දින ශ්‍රේෂ්ඨාධිකරණයෙන් ලබා දුන් අදාල නඩු තීන්දු වල ප්‍රතිඵලයක් වශයෙන් කෝනල් සහ සමාගම පවරා තිබූ ඉහත අවසන් නඩුව දිස්ත්‍රික් අධිකරණය විසින් **<u>2014.5.26</u>** දින නිෂ්ප්‍රභා කිරිම මත **<u>රජය, මිට්සුයි සහ තායිසෙයි සමාගම් සහ HDL සමාගම අමරසේකර සමඟ අත්සන් කල ඉහතකි ගිවිසුම් පූර්ණ වශයෙන් බලාත්මක වීය.</u>**

71. 2014.6.5 දින ඉහත නිශ්ප්‍රභා නියෝගයෙහි සහතික කල පිටපතක් ලබා ගෙන, ඒ අනුව අමරසේකරගේ නීතිඥ සමාගම වන වී. ඩබ්ලිව්. කුලරත්න ඇසෝසියේට්ස් විසින් භාණ්ඩාගාර ලේකම් ආචාර්ය පී. බී. ජයසුන්දර වෙත යොමු කරනු ලැබූ ඔවුන්ගේ 2011.6.11 දිනැති ලිපියෙන් ඒ මත ඔහුට නොතිසි දෙමින්, ***<u>ඉහත සඳහන් ගිවිසුම් වල විධිවිධාන ප්‍රකාරව ඒ යටතේ රජයේ වගකීම් සහ කර්තව්‍යයන් වහාම සම්පූර්ණ කරන ලෙසට ඉල්ලා සිටින ලදී.</u>*** **<u>ආචාර්ය පී. බී. ජයසුන්දර ඒ සම්බන්ධයෙන් කිසිම විරුද්ධත්වයක් දක්වා නොමැත.</u>**

72. **රජය විසින් 'පූර්ව කොන්දේසි' 'පසු කොන්දේසි' වශයෙන් සම්පූර්ණ කරන බවට සත්භාවයෙන් පොරොන්දු වීම මත, අමරසේකර රජය විසින් ලබා දුන් එම ප්‍රතිඥාවන්ට අනුව ඔහුගේ ව්‍යුත්පන්න නඩුදෙක ඉල්ලා අස්කර ගනු ලැබූ අතර, රජයේ බැගපත් අයැදීම් මත ඔහු විසින් කඩිනමින්** රජයේ ඉල්ලීමට අවනත වී කටයුතු කල ආකාරයටම රජයද එලෙසම පෙරලා **ගෞරවාන්විතව පොරොන්දු වූ පරිදි, එකී කොන්දේසි රජය විසින් කඩිනමින් සම්පූර්ණ කරනු ඇතැයි අමරසේකර විශ්වාස කරන ලදී.**

73. ඒ අනුව, 2014.7.4 දින, ශ්‍රී ලංකා මර්චන්ට් බැංකුව විසින් මහා භාණ්ඩාගාරයට ලබා දෙනු ලැබූ අමරසේකරට ගෙවිය යුතු වෘත්තීය වන්දි ගණනය කල වාර්තාව පදනම් කරගෙන ඔහුගේ විගණකවරුන් වන වරලත් ගණකාධිකාරී ජයවීර සහ සමාගම විසින් 2014.6.30 දිනට යාවත්කාලීන කර ඉදිරිපත් කර තිබුණි.

74. ශ්‍රී ලංකා මර්චන්ට් බැංකුව විසින් වෙළඳපොළ සම්මතය අනුව ණය කපාහැරීමට ඒ මත 2% ක වෘත්තීය වන්දි ගෙවීමක් වෙළඳපොළ පිරිමිතිය අනුව බව සනාථ කර තිබූ අතර, එලෙසම වනික් ඉන්කෝපරේෂන් ලිමිටඩ් විසින් කපා නොහැරිය ණය ශේෂය කොටස් වශයෙන් ගෙවීම දීර්ඝ කිරීමට වෘත්තීය වන්දි ඒ මත 1.5 % ක් ලෙස සනාථ කරන ලදී.

75. ඉහත වෘත්තීය වන්දි ගෙවීම්, පැහැර හරින ලද ණය කපා හැරීම සහ ඉතිරි ශේෂය කොටස් වශයෙන් ගෙවීම දීර්ඝ කිරීමට නිගමනය වී තිබෙන්නේ සාමාන්‍යය සාකච්ඡා මාර්ගයෙන් පැහැර හරින ලද ණය පිළිබද මුල්‍ය ප්‍රතිව්‍යුහගත කිරීමක් කිරීමේදීය.

76. **එනමුත්, අමරසේකර ඉහත කර්තව්‍ය ඉටුකර තිබුනේ දැඩි පීඩන හා බාධා මධ්‍යයේ ලේඛන අතිවිශාලයක් අඩංගු වෙහෙසකාරී දීර්ඝ සංකීර්ණ නඩු පවරමින් විශේෂ ජනාධිපති කොමිසමක්ද ඉදිරියේ සාපරාධිත්වය බිදලිය නොහැකි සාක්ෂි හෙලිදරව් කරමින් දැඩි පීඩනයන්ට හා බාධාවන්ට මුහුණ දෙමින්ය.**

77. එය එසේ ක්‍රියාකර තිබියදී, **ඒ අනුව බලාපොරොත්තු වූ පරිදි ක්‍රියා නොකරමින් අමරසේකර කඩිනමින් සත්භාවයෙන් ක්‍රියා කරමින් ඔහුගේ ස්ථාවරයන්ද වෙනස් කිරීමට ක්‍රියා කර තිබුණත්, <u>4.7.2014</u>** දින සිට මහා භාණ්ඩාගාර ලේකම් පී. බී. ජයසුන්දර **<u>පරස්පරව මන්දගාමී ලෙස</u>** ක්‍රියා කරමින් වැඩි කාලයක් ගනිමින් මාස කීපයකට පසු **<u>12.12.2014</u>** වන දින රජය විසින් අමරසේකර වෙත ගෙවිය යුතු වූ මුළු වෘත්තිය වන්දිය අවසාන සහ සම්පූර්ණ ගෙවීමක් වශයෙන් රු. මිලියන 300 ක් යෝජනා කර තිබුනේ **අමරසේකර සමග කිසිදු අයුරක සාකච්ඡාවක් හෝ කතිකාවකින් තොරවය.**

78. එම අවස්ථාවේදී අමරසේකර පත්ව සිටි අසීරුතාවයන් සහ යථාර්ථ තත්වයන් මත, මහා භාණ්ඩාගාරයේ ලේකම් ආචාර්ය පී. බි. ජයසුන්දර විසින් ඔහුගේ **<u>2014.12.12</u>** දින ලිපියෙන් යෝජනා කළ පරිදි **<u>මසක් ඇතුලත ඉහතකී අසාධාරණ මුදල</u>** සම්පූර්ණයෙන් ගෙවීම සිදුකරන බවට පොරොන්දු මත අමරසේකරට එයට එකඟවීමට මිස වෙනත් විකල්පයක් නොතිබුණි.

79. අමරසේකරගේ විගණක වරලත් ගණකාධිකාරී ජයවීර සහ සමාගම විසින් සහතික කල පරිදි, ශ්‍රී ලංකා මර්චන්ට් බැංකුවේ ඉහතකී වාර්තාවේ යාවත්කාලීන ගණනයන් වර්තමාන දිනයක් වන **<u>2014.11.30</u>** දිනට රජයෙන් අමරසේකරට ලැබීමට තිබු වෘත්තීය වන්දි වටිනාකම ගණනය කරන ලදී;

- වෙළඳපොළ සම්මතය **2 %** ක් මත රාජ්‍ය ඇපකර ණය වලින් **<u>කපා හැරිය</u>** වටිනාකම රු**. මිලියන 81,024.2** කට අමරසේකර වෙත ගෙවිය යුතු වෘත්තීය වන්දියෙහි වටිනාකම **රු. මිලියන 1,620.5**, සහ

- වෙළඳපොළ සම්මතය **1.5 %** ක් මත රාජ්‍ය ඇපකර ණය මත එවකට කපා නොහැරිය ණය ශේෂයේ **<u>නැවත කොටස් වශයෙන් ගෙවීමට දීර්ඝ කිරීම</u>** සඳහා අමරසේකර වෙත ගෙවිය යුතු වෘත්තීය වන්දියෙහි වටිනාකම **රු. මිලියන 541.6** කි.

ඒ අනුව, වෙලඳපොළ සාමාන්‍ය පිරිමිතිය අනුව අමරසේකරට **<u>2014.11.30</u>** දිනට ගෙවිය යුතු සම්පූර්ණ වෘත්තීය වන්දි මුදල **<u>රු. මිලියන 2,162.1 ක්</u>** ලෙස ගණනය කර තිබුණි.

80. රජය විසින් ඇතුලත් වූ ගිවිසුම් තුල, ඉහතකී රජය වෙත ලැබුණු එවැනි විශාල ප්‍රතිලාභයක් ලැබුණු බව රජය විසින්ම එම ගිවිසුම් වල ලිඛිතව පිළිගෙන තිබියදිත්, අමරසේකරට වෙළඳපොළ සාමාන්‍ය පිරිමිතිය මත වෘත්තීය වන්දිය **රු. මිලියන 2,162.1** ක් වී තිබියදීද **රු. මිලියන 300** එනම් එයින් **13.9%** ක අත්තනෝමතික මුදලක් සම්පූර්ණ සහ අවසාන ගෙවීමක් කිරීමට මහා භාණ්ඩාගාර ලේකම් ආචාර්ය පී. බී. ජයසුන්දර විසින් යෝජනා කර තිබුණි.

81. ශ්‍රී ලංකා මර්චන්ට් බැංකුවේ වාර්තාවට අනුව යෝජනා කර තිබූ අමරසේකරට කොනල් සහ සමාගම විසින් ගොණු කල නඩු සම්බන්ධයෙන් රජය සහ HDL සමාගම වෙනුවෙන් සාර්ථකව එයට එරෙහිව කටයුතු කිරීම මත ලැබීමට තිබූ වෘත්තීය දීමනා සහ වියදම් පිළිබඳ මෙම පසුබිම මත අමරසේකර නිහඬව සිටින ලදී.

82. කොළඹ වරායේ ඉන්ධන සැපයුම් යටිතල පහසුකම් සහ ඒකාධිකාරය පෞද්ගලීකරණය සම්බන්ධයෙන් අමරසේකර විසින් ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩුවක් ගොණුකර වීමේ ප්‍රතිඵලයන් වශයෙන්, ශ්‍රේෂඨාධිකරණය විසින් එය වංචා සහගත ක්‍රියාවක් වශයෙන් තීන්දු කර නිශ්ප්‍රභා කිරීමෙන්, ආචාර්ය පී. බී. ජයසුන්දරට එරෙහිව උග්‍ර දඬුවමක් ලෙස ඔහුට **<u>රජයේ තනතුරු දැරීමෙන් ඉවත් කිරීමට බල කර විනිශ්චය ලබා දීම මත</u>**, ආචාර්ය පි. බී. ජයසුන්දර රජයේ තනතුරුන් පහ කිරීමෙන් පසුව, නැවත ජනාධිපති මහින්ද රාජපක්ෂ විසින් මහා භාණ්ඩාගාරයේ ලේකම් තනතුරට ආචාර්ය පී. බී. ජයසුන්දරව පත්කිරීමෙන් පසුව ඔහු අමරසේකර සමග ඉමහත් වෛරයෙන් සිටි බව ප්‍රසිද්ධ කරුණක් වී තිබුණි.

83. ඉහතකී රජයෙන් ගෙවිය යුතු යෝජිත වෘත්තීය වන්දි මුදල වන රු. මිලියන 300 සෘජුවම ලංකා බැංකුවට බැර කරන ලෙසට 2014.10.10 දින අමරසේකරගෙන් මහා භාණ්ඩාගාරය ලිපියක් ලබා ගැනීමෙන් පසුව යෝජිත වෘත්තීය වන්දි මුදල පිළිගන්නා බවට 2014.12.12 දින අමරසේකරගෙන් මහා භාණ්ඩාගාරය තවත් ලිපියක් ලබා ගැනීමෙන් පසු මහා භාණ්ඩාගාරයේ ලේකම් ආචාර්ය පී. බී. ජයසුන්දර ලංකා බැංකුවේ නව ගිණුමක් ආරම්භ කිරීමට අමරසේකරට යෝජනා කොට යෝජිත මුදල ගෙවන තෙක් අතුරු පියවරක් වශයෙන් රු. මිලියන 100 ක බැංකු අයිරාවක් තාවකාලිකව 2014.12.17 දින එම බැංකු ගිණුම මගින් අමරසේකරට සලසා තිබුණේ මහා භාණ්ඩාගාරය විසින් යෝජිත මුදල ගිවිසුමක් මත රජයෙන් ලැබිය යුතු වෘත්තීය වන්දිය සෘජුවම 2014.12.31 දිනට එම ගිණුමට බැර කරන බවට සහතික වීමෙනි.

84. ඉහතකී පසුබිම තුල, මහා භාණ්ඩාගාරය විසින් ලංකා බැංකුව වෙත සෘජුව සහතික කල පරිදි, එම රු. මිලියන 100 ක බැංකු අයිරාව මසක් තුලදී මහා භාණ්ඩාගාරය විධිමත්ව ගෙවන බවට පොරොන්දු වී තිබූ පදනම මත අමරසේකර ක්‍රියා කර ඇත.

85. 2014 දෙසැම්බර් මාසයේ දී අමරසේකර හට රු. මිලියන 100 ක් අවශ්‍ය කර තිබුණේ ඔහුගේ නිවාසයේ දේපල කොටසක් විකුණා තිබීමෙන් ඉහතකි පරිදි **<u>2014 ජූනි මාසයේ</u>** ඔහුට රජයෙන් නිසැකවම වෘත්තීය වන්දියක් ලැබීමට නෛතික අයිතියක් ඇති වූ විගස ඔහුගේ එම නිවාසයේ දේපල විකුණූ කොටස **<u>2014.12.31</u> දිනට පෙර නැවත මිලදී ගැනීම සඳහා ගිවිසුමක් එම දේපල අලෙවි කල පාර්ශවය සමග අත්සන් කර තිබූ නිසාය.**

86. ඊට අමතරව අමරසේකර නොයේකුත් මහජන යහපත උදෙසා නඩු ගොණු කර ක්‍රියාත්මක කිරීමේදී ණය වී තිබූ නිසා ඉහතකී මුදල ණය පියවීම සඳහාද අත්‍යවශ්‍ය වි තිබුණි. අමරසේකරගේ එම මහජන සුභසිද්දී නඩු මගින් පහත දක්වා ඇති ආකාරයට **රජයට ඉමහත් ප්‍රතිලාභ අත්කර දී තිබූ අතර,** අමරසේකර ඒ පිළිබඳව රජයෙන් කිසිම වියදමක් හෝ වෙනත් කිසිදු සහනයක් ලබා ගෙන නොතිබුණි.

87. ඉහතකී කරණා අනුව කිසිම කථිකාවකින් හෝ විකල්ප සාකච්ඡාවකින් තොරව මහා භාණ්ඩාගාරයේ ලේකම් ආචාර්ය පී. බී. ජයසුන්දර විසින් අමරසේකර වෙත ලබා දීමට ඉදිරිපත් කරන ලද රු. මිලියන 300 යේ යෝජනාව සාමාන්‍ය වෙළඳපොළ පිරිමිතිය අනුව 30.11.2014 දිනට **රු. මිලියන 2,162.1** ක් එනම් එයින් **<u>13.9 % ක් පමණක්</u> ඉතාමත් ප්‍රමාද වී** අවසන් මොහොතේ යෝජනා කල බැවින් අමරසේකරට වෙනත් විකල්පක් නොතිබුණි - ඉහත 85 ඡෙදය බලන්න.

88. කණගාටුදායක ලෙස 2014.12.31 දිනට පෙර මහා භාණ්ඩාගාරයේ ලේකම් ආචාර්ය පී. බී. ජයසුන්දර විසින් සම්පූර්ණ සහ අවසාන් කිරීමට පොරොන්දු වූ ගිවිසුමද අවසන් නොකොට තිබුණේ **ඒ පිළිබඳ කිසිම සාකච්ඡාවක් හෝ කතිකාවක් ඇති නොකර** අමරසේකරගෙන් ලිඛිතව කලින් 2014.12.12 දින රු. මිලියන 300 ලබා ගැනීම සම්පූර්ණ සහ අවසාන් ගෙවීමක් ලෙසට පිළිගැනීමෙන්ය.

89. ඉහත ක්‍රියාදාමය මගහැරීම මහා භාණ්ඩාගාරයේ ලේකම් ආචාර්ය පී. බී. ජයසුන්දර විසින් අමරසේකරට කරන ලද බරපතල සාපරාධි හානියක් විය. එනමුත් මීට පෙර එවකට භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම් පී. බී. ජයසුන්දරගේ බැගෑපත් අයදීම් මත අමරසේකර විසින් ඔහුගේ ව්‍යුත්පන්න නඩු දෙක සමථයට පත්කර ඉල්ලා අස්කර ගැනීමට කඩිසරව එකඟ වී තිබුණේ **'පූර්ව කොන්දේසිද' 'පසු කොන්දේසි'** වශයෙන් පරිවර්තනය කරන ලද්දේ **අමරසේකරට එසේ කිරීමට කිසිදු බැදීමක් නොතිබුණ අවස්ථාවකදීය**.

90. 2015.1.9 දින රජය වෙනස් වීමත් සමඟ, මෙම කාරණය අතපසු වූ අතර, 2015 මාර්තු මාසයේ දී භාණ්ඩාගාරය ඉහත කාරණයන්හි නිරවද්‍යතාවය පිළිගනිමින්, ඒ මත අමාත්‍ය මණ්ඩල සන්දේශයක් ඉදිරිපත් කරමින් 2015 ජුලි මස තාවකාලික සැලැස්මක් ලෙස ඉහතකී බැංකු අයිරාව තවත් රු මිලියන 125 කින් වැඩි කොට එනම් රු. මිලියන 225 ක් තවත් **මාස 06 කට** දීර්ඝ කොට අමරසේකරට ගෙවීමට තිබුණු මුදල 2015.12.31 දිනට පෙර ගෙවීමට **මහා භාණ්ඩාගාරය විසින් ලංකා බැංකුවට ලිඛිතව සහතික විය.**

91. අමරසේකරට ඉහතකී තාවකාලික සැලැස්ම පිළිගැනීමට කියා එසේ ඉල්ලා සිටින ලද්දේ රජය විසින් කොනල් සහ සමාගමේ වන්දියක් ඉල්ලීම පිළිබඳ සළකා බැලීමට එම අවස්ථාවේදීම එකවර කිරීමට රජයට අවශ්‍ය වූ බැවිනි. කෙසේ වෙතත් අමරසේකර වෙත රජය මගින් වෘත්තීය වන්දි ගෙවීමට බැදී සිටියේ ඉහතකී නීතිමය ගිවිසුම් වලට අනුව බැවින් එය සම්පූර්ණයෙන්ම රජය සහ අමරසේකර අතර ඇති කර ගෙන තිබූ වෙනස්ම නීතිමය බැදීමක් වූ අතර, රජයේ එම ඉල්ලීමට අමරසේකර ඒ අවස්ථාවේ අවනත වුයේ මෙම වෘත්තීය වන්දි ගෙවීම **'පූර්ව කොන්දේසි' යක්වද තිබි 'පසු කොන්දේසි' යකට පරිවර්තනය කර ගැනීමෙන්ද පසුවය.**

92. ඉහත වෘත්තීය වන්දියට අමතරව HDL සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අමරසේකරට ප්‍රමාණවත් නියෝජනයක් ඇතිකිරීම සඳහා ඉහත කී ගිවිසුම්වල කොන්දේසියක් අඩංගු කර තිබූ අතර, **එසේ කිරීමට ඔහුගේ නාමිකයන් තිදෙනෙක් පත් කිරීමට රජය බැදී සිටියේය.**

93. **නැවත නැවතත් සඳහන් කරනු ලබන්නේ අමරසේකර විසින් ඔහුගේ ව්‍යුත්පන්න නඩු දෙක සමථයට පත්කර ඉවත් කර නොගත්තේ නම්, ඒ අනුව අවසන් සහනය ලබා ගනිමින් කටයුතු කලේ නම්, මිට්සුයි සහ තායිසෙයි සමාගම් වෙත කිසිදු අයුරක ගෙවීමක් නොමැති වන අතර, එසේ සිදු වූයේ නම්, අමරසේකරගේ එම ව්‍යුත්පන්න නඩු දෙක වර්ෂ ගණනාවක් පුරා ඉදිරියට ගෙනයැමෙන් අතුරු තහනම් නියෝගය මත HDL සමාගමේ මුදල් ඉතිරි කර ගෙන ජපන් සමාගම් වෙත අඩු ගෙවීමක් කිරීමෙන් ඒ අනුව මිට්සුයි සහ සමාගම සහ තායිසෙයි සමාගම වෙත ලබාදී තිබූ රාජ්‍ය ඇපකර අවලංගු වීමත් සමඟ, HDL සමාගමෙහි වර්තමාන ප්‍රධාන කොටස්කරුවෙකු වන්නේ, වෙනත් අය අතර, රජය නොව අමරසේකර විය හැකිව තිබූ බවයි.**

94. **ඉහත කියාපාන්නේ ඔහුගේ තනි බලය මත ගත හැකිව තිබූ හොඳම සහ නිවැරදිම ව්‍යාපාරික තීරණය වී තිබූ බවත්, ඒනමුත් ඔහු රජයේ බැගපත් අයදීම්වලට සවන් දෙමින් සහ රජයේ අයැදීම් මත එසේ කටයුතු කරනු ලැබුවේ රටේ අභිවෘර්ධිය වෙනුවෙන් බවත්, රජය විසින් එසේ බගැපත්ව අයැද සිටි පරිදි ක්‍රියා කිරීමෙන් පසුව, සැලකිය යුතු ඉතාමත් වැදගත් කාරණයක් වන්නේ ඔහුට ගෙවිය යුතු වෘත්තීය වන්දිය ඔහු සමග රජය ඇතිකරගත් නීතිමය ගිවිසුම් මත 'පූර්ව කොන්දේසියක්' ලෙස පෙර ගිවීමට තිබියදී එම අවස්ථාවේදී අවශ්‍යතාවයන් මත ඔහු විසින් එය රජයේ ඉල්ලීම මත 'පසු කොන්දේසියක්' ලෙස පරිවර්තනය කිරීමට එකඟ වීමෙන් අනතුරුව ගිවිසුම් වලට අනුව ඔහුට ගෙවිය යුතු වෘත්තීය වන්දිය වහාම ලබා දීමට සහ තවද ඔහුගේ ඉහතකී නෛතික අයිතිය ඔහුට අහිමි වීමය.**

95. **2016. 12.31 දිනට** මූල්‍ය වටිනාකම අනුව, ඉහත **කපා හැරිය** වටිනාකම **රු. මිලියන 89,927.6** උදෙසා 2 % සාමාන්‍ය අගය මත වෘත්තීය වන්දිය **රු. මිලියන 1,798.5** එලෙසම ඉතිරි ශේෂයේ වටිනාකමක් වූ **රු. මිලියන 51,884.7** කොටස් වශයෙන් ගෙවීමට **තව දීර්ඝ කරීමට සාමාන්‍ය** 1.5% ක අගය මත මුදල **රු. මිලියන 778.3** වන අතර, ඒ අනුව **2016.12.31 දිනට** වෘත්තීය වන්දිය **රු. මිලියන 2,567.8** ක් වී තිබුණි.

96. අමරසේකර, ඔහු විසින් රචනා කොට ඇමරිකා ඒක්සත් ජනපදයේ පල කරනු ලැබූ පහත සඳහන් ග්‍රන්ථයන්හි, ලේඛනද සමඟින් ඉහතින් සඳහන් කරනු ලැබූ අදාළ සම්පූර්ණ කරුණු හෙළිදරව් කර ඇත.

- # කොළඹ හිල්ටන් හෝටලය ඉදිකිරීමේදී - ශ්‍රී ලංකා රජයට සිදුවූ මහා පරිමාණ වංචාව - ශ්‍රී ලංකාවේ පළමුවන ව්‍යුත්පන්න නඩුව - *'Colombo Hilton Hotel Construction - Fraud on Sri Lanka Government - Vol. 1 - Sri Lanka's First Derivative Action in Law'*
- # සාපරාධිත්වය නිරාවරණය - කොළඹ හිල්ටන් හෝටලය ඉදිකිරීමේදී - ශ්‍රී ලංකා රජයට සිදුවූ වංචාවේ විකෘති ආවරණය - *'Colombo Hilton Hotel Construction - Fraud on Sri Lanka Government - Vol. 2 - Criminality Exposed, but Perversely Covered-up'*
- # වංචාවක් නිරවුල් කිරීම - කොළඹ හිල්ටන් හෝටලය ඉදිකිරීමේදී - ශ්‍රී ලංකා රජයට සිදුවූ වංචාව - *'Colombo Hilton Hotel Construction - Fraud on Sri Lanka Government - Vol. 3 - Settlement of a Fraud'*
- # සමාජ-දේශපාලන යථාර්ථයන් - හිල්ටන් හොටල් මගඩිය සහ තත්කාර්ය නඩු කටයුතු - භුක්තිය පැහැර ගැනීමේ නීතිය - *'Socio-Political Realities - Hilton Hotel Fiasco & Ad hominem Legislation - Expropriation Law'*

97. පහත දක්වා ඇත්තේ රජයට සහ මහජනතාවට අති විශාල ප්‍රතිලාභ අත්කර දුන් අමරසේකරගේ මහජන අයිතීන් මත ක්‍රියාදාමයන් සහ තවත් අවස්ථාවන්හිදී රජය විසින් දේශීය සහ විදේශීය උපදේශකයින් වෙත ගෙවූ **බඳු නිදහස් වෘත්තීය දීමනා,** සමහර අවස්ථාවල එම ගනුදෙනු මගින් රජයට ඉමහත් පාඩුද අත්විමය.

i) **2003 වර්ෂයේදී,** ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව පෞද්ගලීකරණය කිරීම වෙනුවෙන් ප්‍රයිස්වෝටර්හවුස්කූපර්ස් සහ අර්නස්ට් ඇන්ඩ් යංග් වෙත රජය විසින් වෘත්තීය වන්දි වශයෙන් **රු. මිලියන 170** කට වැඩි ප්‍රමාණයක් ගෙවා ඇති අතර, එහි වර්තමාන අගය ආසන්න වශයෙන් **රු. මිලියන 940 කි.**

*මහජන අයිතීන් මත අමරසේකර විසින් ගොණු කරවන ලද නඩු නිමිත්තක් මත ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව ඔහු විසින් නැවත රජයට ලබා දුන් අතර, 2016.12.31 දිනට එහි වටිනාකම **රු. මිලියන 90,300** පමණකි; තවද එයට ලංකා හොස්පිටල්ස් ද අයත් වූ අතර 2016.12.31 දිනට එහි වටිනාකම **රු.***

***මිලියන 15,050 ක් ඇස්තමේන්තු කර ඇත. මෙය සිදු වුයේ ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව පෞද්ගලීකරණ කිරීම ශ්‍රේෂ්ඨාධිකරණය විසින් නීතිමය නොවන, නීති විරෝධී වංචනික ලෙස සිදු කෙරුණු පෞද්ගලීකරණයක් යයි නිගමනය කරමින් අවලංගු කිරීම මතය.*** *(පෞද්ගලීකරණය මත ජාත්‍යන්තර මූල්‍ය අරමුදල, ලෝක බැංකුව සහ ආසියානු සංවර්ධන බැංකුවේ න්‍යාය පත්‍රය - ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව පෞද්ගලීකරණය - නීතිවිරෝධී සහ නීතිමය නොවන බවට ශ්‍රේෂ්ඨාධිකරණය විසින් නිශ්ප්‍රභා කරන ලදී. )* - (*IMF, World Bank & ADB Agenda on Privatisation – Sri Lanka Insurance Privatisation - Annulled as Unlawful & Illegal by Supreme Court*)

ii) **2001 වර්ෂයේදී,** ජාතික රක්ෂණ සමාගම පෞද්ගලීකරණය සිදු කිරීමේදී, රජය විසින් ආතර් ඇන්ඩර්සන් එනම් ජාත්‍යන්තර වංචාවක් වූ එන්රෝන් සමාගමේ විගණනකරුවන් වූ අයට **රුපියල් මිලියන 135** පමණ වෘත්තීය වන්දි ගෙවා ඇති අතර, එය 2016.12.31 දිනට එහි වටිනාකම **රුපියල් මිලියන 870** ඉක්මවා තිබූ අතර එයද ගෙවා තිබුණේ 2001 දී කොටස් විකිණීමෙන් ලැබුණු **රුපියල් මිලියන 450** කට **පමණකි !**

iii) **2003 වර්ෂයේදී,** ලංකා අයිඕසී ලිමිටඩ් පෞද්ගලීකරණය සිදු කිරීමේදී, රජය විසින් අර්නස්ට් ඇන්ඩ් යංග් වෙත **රුපියල් මිලියන 55** ඉක්ම වූ වෘත්තීය වන්දි ගෙවා ඇති අතර, 2016.12.31 දිනට එහි වටිනාකම **රුපියල් මිලියන 290** ඉක්මවා යයි.

මෙම පෞද්ගලීකරණය පිළිබද අමරසේකර පසුව ගත් ක්‍රියාදාමයන්ගේ ප්‍රතිඵලයක් ලෙස, **2005 වර්ෂයේදී රු. මිලියන 5000** ක පමණ 'මිල සූත්‍රයක්' මත *LIOC* විසින් ලංකා රජයෙන් ඉල්ලා තිබූ සහනාධාර කපා හැරීමක් සහ අනාගත සහනාධාර ගෙවීම නවත්වන ලදී. *(පෞද්ගලීකරණය මත ජාත්‍යන්තර මූල්‍ය අරමුදල, ලෝක බැංකුව සහ ආසියානු සංවර්ධන බැංකුවේ න්‍යාය පත්‍රය - ශ්‍රී ලංකාවේ 'දූෂිත ගනුදෙනු' - කිනම් විරෝධාභාසයක්ද)* - (*IMF, World Bank & ADB Agenda on Privatisation – 'Dubious Deals' in Sri Lanka – What a Paradox*)

iv) ඛනිජ තෙල් හෙජින් ගනුදෙනු මත විදේශයේදී ශ්‍රී ලංකා රජයට / ශ්‍රී ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට ඒරෙහිව නඩු පනවා තිබූ අවස්ථාවේදී, වාර්තා වන පරිදි **රු. මිලියන 1232 ක** වියදමක් දැරීමට සිදුවූයේ ශ්‍රී ලංකාව තුළ මහජනතාවගේ අයිතීන් මත අමරසේකර විසින් ගොණු කරනු ලැබූ නඩු නිමිති වලට ගරු නීතිපති ජනාධිපති නීතිඥ මොහාන් පිරිස් මෝඩ ලෙස විරුද්ධ වීම මතය. තවද වාර්තා වන්නේ ස්ටැන්ඩර්ඩ් චාර්ටඩ් බැංකුවේ හිමිකම වශයෙන් **ඇ. ඩො. මිලියන 160 + පොළිය** ශ්‍රී ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව පරාජය වූ බවත් සහ ඩොයිෂ් බැංකුවේ හිමිකම් **ඇ. ඩො. මිලියන 80 + පොළිය** ශ්‍රී ලංකා රජය පරාජය පත්වී අහිමි වූ බවත්ය.

*සිටි බැංකුව ඉල්ලා සිටි හිමිකම් වන **ඇ. ඩො. මිලියන 192 + පොළිය** ප්‍රතික්ෂේප වුයේ සමහරුන් විශ්වාස කරන අන්දමට අමරසේකර එම අවස්ථාවේදීම* මෙම ඛනිජ තෙල් හෙජින් ගනුදෙනු පිළිබදව සවිස්තර ග්‍රන්ථයක් රචනා කොට ගෝලීය වශයෙන් ප්‍රසිද්ධියට පත්කිරීම මත එය ජයගත් බවය. *(ඇමරිකා එක්සත් ජනපදයේ බැංකුව, එක්සත් රාජධානියේ ස්ටැන්ඩර්ඩ් චාර්ටර්ඩ් බැංකුව, ජර්මනියේ ඩොයිෂ් බැංකුව මගින් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව සමඟ ඇති කර ගත් "හෙජින් / ව්‍යුත්පන්න ගනුදෙනු - සැක සහිත සහ නිති විරෝධීද? )* - (*Derivative / Hedging Deals by Citibank, Standard Chartered Bank, Deutsche Bank, with Sri Lanka Government's Petroleum Corporation - Dubious & Illegal ?)*

v) නැවත ගෙවිය යුතු රජය විසින් ලබා ගත් ණය සඳහා පවා, මූල්‍ය උපදේශකවරුන් / වෙළඳ මණ්ඩල වෙත වෘත්තිය වන්දි සහ කොමිස් මුදල් ගෙවනු ලැබේ. නමුත් මෙම අවස්ථාවේදී මෙය අමරසේකර **2016.12.31 දිනට** රජයේ ඇපකර මත වටිනාකම **රු. මිලියන 89,927.6 රජයේ** සම්පූර්ණ නය **කපා හැරිමකි.** තවද_ **2016.12.31** දිනට

වටිනාකමක් ඇති රු. **මිලියන 51.884.7 ශේෂය කොටස් වශයෙන් දීර්ඝ කොට ගෙවීමට එකගත්වයකට ඒමය. අමරසේකර සමග ඇතිකරගත් ඉහතකී ගිවිසුම් මත, රජයට ඇපකරු ලෙස ඉමහත් ප්‍රතිලාභයක් ලබාදුන් බව රජය විසින්ම ඉහතකී එම ගිවිසුම් වල ලිඛිතව පිළිගෙන ඇත.**

vi) වාර්තා වී ඇති පරිදි, රජයේ ආදායම ආසන්න වශයෙන් රු. මිලියන 200,000 පමණ කපා හැරීම වළක්වා ලමින් සහ නිතියේ ආධිපත්‍යය සහ යහ පාලනය බාදනය වීම වළක්වා ගැනීමට හැකිවන පරිදි 'බදු සමා මුවාවෙන්' 2003 වර්ෂයේදී සිදු කල එම බෙදජනක පනත 2004 වර්ෂයේදී අවලංගු කිරීමට අමරසේකරට හැකි විය. මේ සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුවෙහි අනෙකුත් දේ අතර පහත පරිදි ප්‍රකාශ කර ඇත. -

> "එය, නීතියේ ආධිපත්‍යයට විරුද්ධ, 'සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනයේ සහ ජාත්‍යන්තර සම්මුතිය' ට විරුද්ධ සහ එමගින් රජය වෙත පුළුල් අලාභයක් සිදු වන රාජ්‍ය ආදායම වංචා කිරීමකි." *(රාජ්‍ය මූල්‍ය කළමනාකරණ අවපාලනය, විනිවිදභාවය සහ මහජන වගවීමක් නොමැතිකම - ජාත්‍යන්තර මූල්‍ය අරමුදල, ලෝක බැංකුව සහ ආසියානු සංවර්ධන බැංකුවේ විෂය පථය යටතේ ශ්‍රී ලංකාව ) - (Transparency & Public Accountability Fiscal Mismanagement & Lack of Public Accountability Case Study - Sri Lanka, a Country under the purview of IMF, World Bank, ADB)*

*vii)* අමරසේකර විසින් මහජන අයිතීන් මත ගොණු කරවනු ලැබූ තවත් නඩු නිමිත්තක් මගින් කොළඹ වරායේ ඉන්ධන සැපයුම් යටිතල පහසුකම් සහ ඒකාධිකාරය නැවත රජයට ලබා දෙන ලදී. එහි වටිනාකම 2016.12.31 දිනට ආසන්න වශයෙන් **රු. මිලියන 20,000.** එහි ප්‍රතිපලයක් වුයේ කලින් කර තිබු පෞද්ගලීකරණය ශ්‍රේෂ්ඨාධිකරණය විසින් නීති විරෝධී, නීතිමය නොවන සහ වංචනික පදනම මත අවලංගු කිරීමෙන්ය. *(ජාත්‍යන්තර මූල්‍ය අරමුදල, ලෝක බැංකුව සහ ආසියානු සංවර්ධන බැංකුවේ න්‍යාය පත්‍රයන්ට අනුව පෞද්ගලීකරණය - කොළඹ වරායේ ඉන්ධන සැපයීම් පෞද්ගලීකරණය - ශ්‍රේෂ්ඨාධිකරණය විසින් නීති විරෝධී සහ වංචාසහගත බවට නිශ්ප්‍රභා කරන ලදී. )* - *(IMF, World Bank & ADB Agenda on Privatisation – Colombo Port Bunkering Privatisation – Annulled as Illegal & Fraudulent by Supreme Court)*

*vii)* අමරසේකර විසින් 2008 විසර්ජන පනත් කෙටුම්පත අභියෝගට ලක් කිරීමෙන් රජය විසින් ගනු ලබන මුළු නිවැරදි ණය ප්‍රමාණය හෙළිදරව් වූ අතර, ශ්‍රේෂ්ඨාධිකරණය විසින් 'අයවැය තුල අයවැයක්' ලෙස සඳහන් කරනු ලැබූ, අදාළ ප්‍රතිපාදන 'සංවර්ධන වැඩසටහන්' වෙනුවෙන් යොදවන ලෙස දක්වමින්, වෙනත් රහසිගත ගනුදෙනු වලට මහා භාණ්ඩාගාරය විසින් යොදා ගෙන ඇති බව හෙළිදරව් විය. *(රාජ්‍ය මූල්‍ය කළමනාකරණ අවපාලනය, විනිවිදභාවය සහ මහජන වගවීමක් නොමැතිකම - ජාත්‍යන්තර මූල්‍ය අරමුදල, ලෝක බැංකුව සහ ආසියානු සංවර්ධන බැංකුවේ විෂය පථය යටතේ ශ්‍රී ලංකාව ) - (Transparency & Public Accountability Fiscal Mismanagement & Lack of Public Accountability Case Study - Sri Lanka, a Country under the purview of IMF, World Bank, ADB)*

98. ඔහුගේ සේවය සේවාදායකයින් විසින් අගේ කොට ඉල්ලා සිටීම මත, අමරසේකර / කන්සල්ටන්ස් 21 ලිමිටඩ් සමාගමට වෘත්තීය ගාස්තු ඉහල මට්ටමකින් ලබා ගැනීමට හැකියාවක් තිබේ. ඔහු විසින් එසේ ඉපයූ ධනයෙන් සහ තවත් ණය ලබා ගැනීම් මගින් මහජන අයිතීන් උදෙසා ක්‍රියා කොට, එමගින් රජයට අති මහත් ප්‍රතිලාභ ලබාදී තිබුණේ රජයට කිසිම වියදමක් දැරීමට සිදු නොකරමින්ය. මේ සඳහා ඔහුට රජයෙන් කිසිම වියදමක්වත් හෝ තීරු බදු රහිත වාහනයක් පවාද ලබා දී නොතිබුණි !

99. ඔහු අන් අයගේ මුදල් මත රාජ්‍ය නොවන සංවිධාන මගින් ක්‍රියා නොකරයි. අමරසේකර විසින් වංචාවට සහ දූෂණයට එරෙහිව ක්‍රියා කිරීමේ සේවය සහ එය ඉහතකී ලෙස ඔහුගේම වැයමින් සහ මුදලින් කරන ලද බවට ප්‍රසිද්ධියක් නොදෙන ලදී. **<u>ඉහත හිල්ටන් හෝටලය පිළිබඳ කාරණය ඔහුගේම</u> <u>පෞද්ගලික ව්‍යාපාරික</u> <u>කටයුත්තක් වූ අතර එය මහජන අයිතීන් මත වූ නඩු නිමිත්තක් නොවිය.</u>**

100. i) 1978 වර්ෂ කාලයේ සිටම, සිය වෘත්තීය සේවාවන්ට අමතරව, ඔහු වෘත්තීය ගෙවීමක් අය නොකර රජයට ගරු සේවාවන් කර ඇත. ඒ සමයේම 1980 වසරේ දිවයින පුරා ක්‍රියාත්මක වූ ශ්‍රී ලංකා ප්‍රවාහන මණ්ඩලයේ අර්ධ කාලීන මූල්‍ය අධ්‍යක්ෂක ලෙස ගෞරව සේවා පදනම මත ජනාධිපති ජේ. ආර්. ජයවර්ධන විසින් අමරසේකරව විශේෂ විධායක මණ්ඩලයකටද පත් කර තිබුණි.

ii) එවකට භාණ්ඩාගාර ලේකම්, ආචාර්ය ඩබ්ලිව්. එම්. තිලකරත්න විසින් ශ්‍රී ලංකා ප්‍රවාහන මණ්ඩලයට වර්ෂයකට රු. මිලියන 300 ක පමණ සහනාධාර දීමට හැකි වුනු බව අමරසේකරට දන්වා තිබුණි. (එය 2016.12.31 දිනට වටිනාකම වර්ෂ දෙකක් සඳහා රු**. මිලියන 30,000** ඉක්මවා යයි.)

iii) ඒ කෙසේවෙතත්, අමරසේකර දිවයින පුරා මූල්‍ය කටයුතු පාලනය කරමින්, කාලසටහන් අනුව 93 % ක ධාවන මට්ටමක් ක්‍රියාත්මක කර තිබුණේ **<u>මහා භාණ්ඩාගාරයෙන් කිසිදු සහනාධාර මුදලක් ලබා නොගනිමිනි</u>.**

iv) අමරසේකරට ඔහුගේ වෘත්තීය කටයුතු වල පීඩනය නිසා, වසර දෙකකට පසු ඉහතකී කර්තව්‍යයෙන් 1982 වසරේ ඉල්ලා අස් වූයේ බැංකුවේ රු. මිලියන 80 කට වඩා ස්ථාවර තැන්පතු ඉතිරි කිරීමෙනි. ( 2016.12.31 දිනට එම වටිනාකම රු**. මිලියන 10,000** ඉක්මවා යයි.)

v) 1981 දෙසැම්බර් 19 දිනැති හැන්සාඩ් වාර්තාවේ ලේඛනගත වී ඇති පරිදි, ගරු. ප්‍රවාහන අමාත්‍ය එම්. එච්. මොහොමඩ්, ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව තුළ පහත පරිදි අමරසේකරගේ ඉහතකි සේවය අගය කොට ඇත. -

**පාර්ලිමේන්තුව**

**1981 දෙසැම්බර් 19**

**4310 - 4311**

''සභාපතිතුමනි, මම දැන් ගමනාගමණ මණ්ඩල පිළිබඳව සතුටු වන්නෙමි. මන්නාරමේ මන්ත්‍රීවරයා පෙන්වා දුන් පරිදි අපට පාඩුව රුපි. මිලියන 250 දක්වා අඩුකර ගැනීමට හැකිවී ඇතැයි කීමට සතුටුවෙමි. එය භාණ්ඩාගාරය 1982 වර්ෂයේදී පාඩුව රුපි. බිලියන 1.2 විය හැකියයි පෙන්වා සිටියදීය. මම සැමවිටම එම සංඛ්‍යාව සමග එකඟ නොවීමි. එම සංඛ්‍යාව හරියටම නිවැරදි නොවන බව මට දැනී මම කියා සිටියෙමි. එහෙත් එය සැමවිටම රුපි. මිලියන 500 සිට 600 අතර වනු ඇතැයි මම බලාපොරොත්තු වූයෙමි. වර්තමාන මණ්ඩලයට පාඩුව රුපි. මිලියන 250 පමණ දක්වා අඩු කිරීමට හැකිවීම ගැන මම සතුටු වෙමි. එය හොඳ ආරම්භයකි. මම සුභපැතිය යුත්තේ මාගේ ලේකම් සහ සභාපති ගාමිණී විජේසේකර සහ මූල්‍ය අධ්‍යක්ෂක නිහාල් අමරසේකර මහතාටය - ඔහු වරලත් ගණකාධිකාරී වරයෙක් සහ ඉතාමත් දක්ෂ ගිණුම්කරණ නිලධාරියෙකි. ඔහුගේ උපදෙස්වලින් සභාපතිවරයාට මෙම ජයග්‍රහණය ලබා ගැනීමට හැකි විය.

තවද අපි අපගේ සියළුම සේවකයින්ට රුපි. 300 බොනස් මුදලක් ගෙවීමට තීරණය කර ඇත්තෙමු. ඒ සඳහා විශාල ලාභයක් උපයාගැනීම අවශ්‍ය නොවේ. අපි පසුගිය කාලයේ රුපි. 217 ක් ගෙවමින් සිටියෙමු. මම මෙම කරුණ කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කර මණ්ඩලය විසින් මෙම වසරේ සිට සේවකයින්ට රුපි. 300 ක් බෝනස් වශයෙන් ගෙවීමට තීරණය කර ඇත.

දැන් ගිණුම්කරණ පද්ධතිය වෙනස් කර ඇති අතර ඔවුන් ප්‍රතිබාදනය කිරීම් සහ පාලනයන් විශාල ප්‍රමාණයක් යොදවා ගෙන ඇත. ඔවුන්ගේ උපදෙස් මත අපට යම් තද පාලනයන් ඇති කිරීමට හැකිවී ඇත. මෙසේ කිරීමෙන් අපට පාඩුව අඩුකර ගැනීමට හැකිවී ඇත.

ඔවුන් විසින් හඳුන්වාදෙන ලද සමහර දේවල් වන්නේ, වැඩිදියුණු කළ පිරිවැය පාලන ක්‍රමයන්, වැඩිදියුණු කළ බඩු වට්ටෝරු පාලන ක්‍රමයන්, බඩු තොග අඩු කිරීම, ස්වේච්ඡාවෙන් විශ්‍රාම යාමේ යෝජනාක්‍රම, වැඩිදියුණු කළ ආරක්ෂක සහ වංචා වැළැක්වීමේ ක්‍රමයන්ය. මම ඒ පිළිබඳව සතුටු වෙන අතර, විශිෂ්ඨ වැඩක් කිරීම පිළිබඳව මම මගේ ලේකම් සහ සභාපති සහ මණ්ඩලයට ශුභ පැතිය යුත්තෙමි.''

vi) ලෝක බැංකු ආධාර යටතේ එක්සත් රාජධානියේ ක්‍රවුන් ඒජන්සි සමාගමේ උපදේශකවරුන් 4 දෙනෙකු බැහැර කොට අමරසේකර එම ව්‍යාපෘතියේ කර්තව්‍යයන් සාර්ථකව නිම කළේ ඇ. ඩො. මිලියන 1.9 ක් ඉතුරු කර ගනිමිනි. ( 2016.12.31 දින වන විට එම වටිනාකම රු**. මිලියන 243** ක් පමණ වේ.)

vii) අමරසේකරගේ ඉහත සේවයන් ජාත්‍යන්තර ඇගයීම් දූත මණ්ඩල විසින් ප්‍රශංසාවට ලක් කල අවස්ථාවන් පිලිබඳව සඳහන් කරන ලද 1983.6.8 දිනැති මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂකගේ පහත සඳහන් ලිපියට අමරසේකරගේ නිහතමානීකම මත අවශ්‍ය වී තිබූ පිළිතුරු ලබා දී නොතිබුණි.

භාණ්ඩාගර අංකය: PEI/COMPAC. **මහා භාණ්ඩාගාරය**
ඔබේ අංකය:

කොළඹ, 1983 ජූනි 8

නිහාල් ශ්‍රී අමරසේකර මයා,
167 බී, ශ්‍රී විපුලසේන මාවත,
කොළඹ 10.

<u>තොරතුරු පරිගණකගත කිරීම - ශ්‍රී ලංකා මධ්‍යම ගමනාගමන මණ්ඩලය.</u>

මෙහි පහත කියවෙන පරිදිවූ තොරතුරු කළමනාකරණය සහ රාජ්‍ය පරිපාලනයේදී පරිගණක භාවිතය පිළිබඳ අන්තර් කලාපීය උපදේශක පී. ඩබ්. පී. බ්‍රවුන් මහතාගේ 1982 නොවැම්බර් 17 වන සිට දෙසැම්බර් 9 වන දින දක්වාවූ දූත මෙහෙ වාර්තාවේ උධෘතයකට මම අවධානය යොමු කරමි.

''යම් සංවිධානයක ප්‍රයෝජනවත් පරිගණකගත කිරීමක් කරගෙන යා හැක්කේ කළමණාකරණයේ ක්‍රියාත්මක සහභාගීවීම සහ ඒ සඳහාවූ අභිලාෂයෙන් පමණකි. වඩාත් හොඳ තොරතුරුවල අවශ්‍යතාවය සඳහා කළමනාකරණය වෙත හැඟීමක් තිබිය යුතු අතර පරිගණකගත කිරීම හරහා එයට සහය දැක්විය යුතුය. ඔවුන් පරිගණකගත කිරීමෙන් මොනයම් වැඩිදියුණුවක් ලබාදිය හැකිදැයි තේරුම් ගත යුතුය. එවන් අවබෝධතාවක් ඇතැයි පෙනී ගිය මාගේ දූත මෙහෙයෙහිදී හමුවූ එකම කළමනාකරු වූයේ එක අවුරුද්දකින් පමණ පරිගණකගත පාලන පද්ධති 10 පිහිටවූ ශ්‍රී ලංකා ගමණාගමන මණ්ඩලයේ (මූල්‍ය) අධ්‍යක්ෂක (නිහාල් ශ්‍රී අමරසේකර මහතාය).''

ඉන්දියා රජයේ කලින් මුදල් අමාත්‍යාංශයේ ලේකම්වූ සහ දැනට රාජ්‍ය ව්‍යවසාය ජාත්‍යන්තර මධ්‍යස්ථානයේ (කණ්ඩායම් නායක) ප්‍රැක්සි ෆර්නෑන්ඩෙස් මයා, ඉන්දියාවේ අයිඑල්ඕ ප්‍රාදේශීය කාර්යාලයේ, අධ්‍යක්ෂක ෆිලිප් නෙක් මයා, මැලේසියාවේ, රාජ්‍ය ව්‍යවසාය අමාත්‍යාංශයේ, එජා උපදේශක, ආචාර්ය ටෝනි බෙනට්, පොදුරාජ්‍ය මණ්ඩල මහලේකම් කාර්යාලයේ, සහකාර අධ්‍යක්ෂක, රාජා ගෝමස් මයා, අයිඑල්ඕ ප්‍රාදේශීය කාර්යාලයේ ඵලදායිතා උපදේශක යෂිකෝ ඉනෝඉ මයාගෙන් සමන්විත එක්සත් ජාතීන්ගේ සහායෙන් යුත් ජාත්‍යන්තර උපදේශක කණ්ඩායමක් 'ශ්‍රී ලංකාවේ රජය සහ රාජ්‍ය ව්‍යවසාය - සමබඳතා පිළිබඳ අධ්‍යයනයක්' නමින්වූ ඔවුන්ගේ අධ්‍යයනයේදී කියා ඇත්තේ

''ශ්‍රීලංගම හි මූල්‍ය අධ්‍යක්ෂක විසින් එක් එක් බස් ඩිපෝවේ සහ සැබෑවින්ම වාහන සමූහයේ එක් එක් වාහනයේ කාර්යසාධනයට කළමනාකරණයට නොකඩවා අවතීර්ණ වීමට හැකියාව ඇති තොරතුරු පද්ධතියක් හඳුන්වාදී ඇත. මෙම පද්ධතියෙන් වාහන භාවිතය, බර පැටවීමේ සාධකය, ඉන්ධන පරිභෝජනය, ටයර් පරිභෝජනය, පාරේ කිලෝමීටරයක් බැගින් ඉපයීම, පාරේ කිලෝමීටරයක් බැගින් වැයකිරීම, සහ විවිධ ඵලදායිතා සාධක පිළිබඳව මෙම පද්ධතියෙන් තොරතුරු ආවරණය කරයි. මෙම තොරතුරු පරිගණකගත කර ඇති අතර එමගින් ශ්‍රීලංගම හි ඉහළ කළමනාකරණයට සිදුවන්නේ කුමක්දැයි දැනගැනීමට ඉඩ සළසයි.''

2. ඔබ රාජ්‍ය අංශයෙන් ඉවත්ව ගොස් ඇති බැවින් මෙම ක්ෂේත්‍රයේ මතුපරම්පරාවට ඔබගේ පළපුරුද්ද මත ප්‍රකාශයක් ඉතාමත් වැදගත් වනු ඇත. ජ්‍යෙෂ්ඨ තීරණ ගැනීමේ මට්ටමේදී පුළුල් නිරාවරණය කිරීමක් සඳහා ඔබට මෙම කාර්යයේදී පැවතුන තොරතුරු පද්ධතිය, යොදාගත් මූලෝපායන් සහ උපානැණ, මුහුණදුන් දුෂ්කරතා, ජයග්‍රහණයන් සහ පසුබෑම් සහ අනාගතය සඳහා යෝජනා ඇතුලත් සටහනක් ඔබට සකස් කළ හැකි දැයි මම විමසිලිමත් වෙමි. මෙම මූලාංගයන් හුදෙක් යෝජනාවන් පමණක් වන අතර ඔබට කැමති පරිදි මෙම සටහන සකස් කිරීම සඳහා ඔබට ආරාධනා කරමි.

අත්/- අපැහැදිලිය
එම්. සෝමසුන්දරම්
අධ්‍යක්ෂක
රාජ්‍ය ව්‍යවසාය අංශය.



එස්. පී. ශ්‍රීස්කාන්ත, එල්එල්. එම් (එ.රා.),
නීතිඥ,
සොලිස්ටර් (එංගලන්තය සහ වේල්ස්)

මුල් පිටපත 2016.9.30
යාවත්කාලීන කිරීම 2017.1.1